බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

21 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022

# උපකාරක ප්‍රශ්න පත්‍ර

විෂයය - ආර්ථික විද්‍යාව

පත්‍රය - I

කාලය : පැය දෙකයි.

උපදෙස්:-

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.

22 A/L අපි [ papers group ]

1. පහත දැක්වෙන්නේ සූක්ෂම හා සාර්ව ආර්ථික විද්‍යා සංකල්ප කිහිපයකි.

A. විරැකියා මට්ටම
B. ආර්ථික උත්පාත හා අවපාත
C. ආන්තික පිරිවැය
D. විකල්ප අතර තේරීම් කිරීම
E. උද්ධමනය

ඉහත ඒවා අතරින් සාර්ව ආර්ථික විද්‍යාවේදී අධ්‍යයනය කරන ඒකක වන්නේ,


1. A, B හා C
2. C, D හා E
3. B, C හා D
4. A, D හා E
5. A, B හා E

2. ස්ථාවර ප්‍රාග්ධනයේ සංරචකයන් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

1. මෙවලම් උපකරණ , යන්ත්‍ර සූත්‍ර , නිමි භාණ්ඩ
2. අමුද්‍රව්‍ය තොග ,අර්ධ නිමිද්‍රව්‍ය තොග , නිමි භාණ්ඩ තොග
3. ජල සම්පාදන ක්‍රම , බුද්ධිමය දේපළ ආශ්‍රිත වත්කම් , වගා කරන ලද ඉඩම්
4. මහා මර්ග, ගුවන්තොටුපොළ , අර්ධ නිමි ද්‍රව්‍ය
5. පරිගණක මෘදුකාංග, පරිලේඛන, කිරිගවයන්

3. පහත සඳහන් දෑ අතුරින් මිශ්‍ර ආර්ථික පද්ධතියක ලක්ෂණයක් නොවන්නේ,

1. ආර්ථිකයක ප්‍රධාන ක්‍රියාකාරී අංශ වන්නේ පාරිභෝගිකයා , නිෂ්පාදකයා නිෂ්පාදන සම්පත් හිමිකරුවෝ හා ආණ්ඩුවයි.
2. පෞද්ගලික අංශය අභිප්‍රේරණය කෙරෙන සාධකය ස්වාර්ථය වන අතර පොදු අංශය අභිප්‍රේරණය කරන සාධකය පොදු යහපතයි.
3. සම්පත් බෙදා වෙන්කිරීම පිළිබඳ තීරණ පෞද්ගලික අංශය මගින් සිදුකරයි සැලසුම් යාන්ත්‍රණය මගින් තරගය ක්‍රියාත්මක කරයි.
4. ආණ්ඩුව ආර්ථිකය තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.
5. පෞද්ගලික අංශය හා පොදු අංශය යන දෙකම නිෂ්පාදන සම්පත් හිමිකරගෙන සිටී.

4. 


මෙහි දැක්වෙන්නේ ආර්ථිකයක භාණ්ඩ වර්ග දෙකක් නිපදවන ආකාරය පෙන්නුම් කරන නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයකි . එහි A ලක්ෂයේ සිට B ලක්ෂයට නිෂ්පාදනය මාරු වීමට හේතුවක් වන්නේ,


22 A/L අපි [ papers group ]

1. කාර්මික භාණ්ඩ සදහා යොදාගන්නා තාක්ෂණය දියුණු වීම.
2. භාණ්ඩ වර්ග සදහා යොදාගන්නා තාක්ෂණය දියුණු වීම.
3. කාර්මික භාණ්ඩ නිෂ්පාදනය සදහා නව සම්පත් යොදා ගැනීමයි.
4. කෘෂිකාර්මික භාණ්ඩ වලට සාපේක්ෂව කාර්මික භාණ්ඩ නිෂ්පාදනයේ ඵලදායිතාව ඉහළ යාම.
5. කෘෂිකාර්මික භාණ්ඩ සදහා යොදගත් හිග සම්පත් කාර්මික භාණ්ඩ නිෂ්පාදනය වෙත වෙන්කිරීමයි.

5. සාමාන්‍ය භාණ්ඩයක මිල ප්‍රතිවිපාක සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න
1. මිල පහළ යාමකදී ආදේශන ප්‍රතිවිපාකය සෘණ වේ.
2. මිල පහළ යාමකදී ආදායම් ප්‍රතිවිපාකය ධන වේ.
3. මිල ඉහළ යාමකදී ආදේශන ප්‍රතිවිපාකය සෘණ වේ.
4. මිල ඉහළ යාමකදී ආදායම් ප්‍රතිවිපාකය සෘණ වේ.
5. මිල පහළ යාමකදී මිල ප්‍රතිවිපාකය සෘණ වේ.

6. භාණ්ඩයක සැපයුම් වක්‍රය දකුණට විතැන් කරනුයේ පහත සදහන් කවරක්ද?
1. අනාගතයේ සලකා බලන භාණ්ඩයේ මිල අඩුවෙතැයි නිෂ්පාදකයා අපේක්ෂා කිරීම
2. නිෂ්පාදනයට යොදාගන්නා යෙදවුම් මිල වැඩිවීම.
3. තාක්ෂණය යල්පැනීම.
4. රජය නිෂ්පාදකයාට ලබාදෙන සහනාධාර කපාහැරීම.
5. අනාගතයේ සලකා බලන භාණ්ඩයේ මිල වැඩිවෙතැයි නිෂ්පාදකයා අපේක්ෂා කිරීම.

7. (A) QS = -12+ 2p (B) QS = 2p (C) QS = 12+4p
ඉහත දක්වා ඇත්තේ සැපයුම් සමීකරණ කිහිපයකි. ඒ අනුව නිවැරදි පිළිතුර තෝරන්න.
1. A සැපයුම් සමීකරණය නම්‍ය වන අතර ඊට අදාළ සැපයුම් වක්‍රය ප්‍රමාණ අක්ෂය සම්මුඛ කරයි.
2. B සැපයුම් සමීකරණය ඒකීය නම්‍ය වන අතර ඊට අදාළ සැපයුම් වක්‍රය දිගේ ඉහළට ගමන් කරන විට සැපයුමේ මිල නම්‍ය අගය ඉහළ යයි.
3. C සැපයුම් සමීකරණය අනම්‍ය වන අතර ඊට අදාළ ඉල්ලුම් වක්‍රය දිගේ ඉහළට ගමන් කරන විට සැපයුමේ මිල නම්‍යතාවය ඉහළ යයි.
4. A සැපයුම් සමීකරණය අනම්‍ය වන අතර ඊට අදාළ සැපයුම් වක්‍රය මිල අක්ෂය සම්මුඛ කරයි.
5. C සැපයුම් සමීකරණය නම්‍ය වන අතර ඊට අදාළ සැපයුම් වක්‍රය ප්‍රමාණ අක්ෂයට සම්මුඛ කරයි.

8. 


මෙම ප්‍රස්තාර සටහනට අනුව D.D ඉල්ලුම් වක්‍රය සෘජුකෝණාස්‍ර බහුවලයක හැඩයක් ගනී. මෙහි A ලක්ෂයෙන් දක්වෙන ඉල්ලුම් ප්‍රමාණයට අදාල මිල වන්නේ,

1. රු. 20 කි.
2. රු. 22.50 කි.
3. රු. 7.50 කි.
4. රු. 24 කි.
5. රු. 36 කි.

22 A/L අපි [ papers group ]

9. එක්තරා වෙළෙඳපොළක අධි ඉල්ලුම් සමීකරණය $ED = 120 - 4p$ වේ. සැපයුම් සමීකරණය $Qs = -20 + 4P$ වේ. සමතුලිත මිලේදී නිෂ්පාදන අතිරික්තය වන්නේ

1. රු. 1200 කි. 2. රු. 1080 කි. 3. රු. 1680 කි. 4. රු. 490 කි. 5. රු.1250 කි.

10. කිසියම් වෙළඳපොළ ක්‍රියාකාරීත්වයකදී ඉල්ලුම් 20% කින් වැඩි වූ අතර සැපයුමද 20% කින් වැඩි විය. මෙවැනි තත්වයක් යටතේ වෙළඳපොළ සමතුලිතය පිළිබඳ කුමක් කිව හැකි ද?

1 .සමතුලිත මිල වෙනස් වේ.
2. සමතුලිත ප්‍රමාණය වෙනස් නොවේ.
3. සමතුලිත මිල හා ප්‍රමාණය යන දෙකම සමාන ප්‍රතිශතයකින් වෙනස් වේ.
4. සමතුලිත මිල වෙනස්වනවාට වඩා වැඩි ප්‍රතිශතයකින් සමතුලිත ප්‍රමාණය වෙනස් වෙනස් වේ.
5. සමතුලිත මිල වෙනස් නොවන අතර සමතුලිත ප්‍රමාණය පමණක් වෙනස් වේ.

11. සාමාන්‍ය භාණ්ඩයක ඉල්ලුම් මා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$Qd = 50 - 5p$ $Qs = -10 + 5p$

මෙම භාණ්ඩය අලෙවිකල හැකි අවම මිල රු. 8 ක් ලෙස රජය නියම කලේ නම් විකුණුම් කරුට ලැබෙන වෙළෙඳපොළ මිල වන්නේ


1. රු.4 කි. 2. රු.1 කි. 3. රු.8 කි. 4. රු.2 කි. 5. රු.6 කි.

12. සාමාන්‍ය භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් ලේඛනය පහත දැක්වේ.

| මිල (රු) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) | සැපයම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 0 | 280 | 80 |
| 4 | 240 | 120 |
| 8 | 200 | 160 |
| 12 | 160 | 200 |
| 16 | 120 | 240 |
| 20 | 80 | 280 |

මෙම භාණ්ඩය මත රු.4 ක ඒකක බද්දක් පැනවීමට රජය ක්‍රියා කලේ නම්,

| | බද්දට පෙර සමතුලිත මිල | බද්දට පසු සමතුලිත ප්‍රමාණය |
|---|---|---|
| 1. | 16 | 120 |
| 2. | 10 | 160 |
| 3. | 12 | 160 |
| 4. | 6 | 140 |
| 5. | 12 | 140 |

13. 


කිසියම් භාණ්ඩයක් සම්බන්ධ වෙළෙඳපොළ තොරතුරු මෙම ප්‍රස්තාර සටහනේ දැක්වේ. එම භාණ්ඩය මත ඒකක බද්ද පැන වූ පසු බද්දට පෙර නිෂ්පාදන අතිරික්තය, බද්ද නිසා අහිමි වූ ආර්ථික අතිරික්තය සහ රජයේ බදු ආදායම දැක්වෙන පිළිතුර වන්නේ,

| | බද්දට පෙර නිෂ්පාදන අතිරික්තය | අහිමි වූ ආර්ථික අතිරික්තය | රජයේ බදු ආදායම |
|---|---|---|---|
| 1. | B +C | B+C+D+E | B+C+D+E+F+I |
| 2. | C+D+J+I | B+E+F | F+I |
| 3. | C+D+I+J | B+C+D+E+F+I | B+C+D+E |
| 4. | A+B+E+F | B+ C+D+E+F+I | B+E |
| 5. | J | F+I | B+C+D+E |

14. පහත දැක්වෙන්නේ වෙළඳපොළේ භාණ්ඩයක් මත රු.5 ක ඒකක සහනාධාරයක් ලබා දුන් පසු ඉල්ලුම් හා සැපයුම් සමීකරණය.

$Qd = 120 - 4P_b \quad QS = 10 + 6P_b$

සහනාධාරය පැනවීමට පෙර සමතුලිත මිල හා ප්‍රමාණය පිළිවෙලින් දැක්වෙන්නේ

1. 30 , 50 2. 64 , 32 3. 28 , 64 4. 14 , 62 5. 14 , 64

15. විදුලිය සැපයීම, සිමෙන්ති, බාබර් සාප්පු, යන දෑ සම්බන්ධ වෙළෙඳපොළ ව්‍යුහ අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. කතිපයාධිකාරය , ඒකාධිකාරිතරගය , පූර්ණ තරගය
2. ඒකාධිකාරය , කතිපයාධිකාරය , ඒකාධිකාරිතරගය
3. ඒකාධිකාරය , ඒකාධිකාරිතරගය , පූර්ණ තරගය
4. ඒකාධිකාරය , කතිපයාධිකාරය , පූර්ණ තරගය
5. ඒකාධිකාරිතරගය , පූර්ණ තරගය , කතිපයාධිකාරය

16. කිසියම් නිෂ්පාදන ආයතනයක මුළු පිරිවැය සහ ආන්තික පිරිවැය පිළිබඳ දත්ත පහත වගුව මගින් පෙන්නුම් කරයි.


| නිමැවුම් ඒකක | මුළු පිරිවැය (රු) | ආන්තරික පිරිවැය( රු) |
|---|---|---|
| 1 | 800 | 80 |
| 2 | 860 | 60 |
| 3 | 900 | 40 |
| 4 | 960 | 60 |
| 5 | 1040 | 80 |
| 6 | 1140 | 100 |

22 A/L අපි [ papers group ]

ඒකක හතර නිෂ්පාදනය කරන විට සාමාන්‍ය ස්ථාවර පිරිවැය වන්නේ,

1. රු. 80 කි. 2. රු. 900 කි. 3. රු.240 කි.
4. රු. 360 කි. 5. රු. 180 කි.

17.




22 A/L අපි [ papers group ]

ඉහත දැක්වෙන්නේ දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රයයි. ඒ අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. ප්‍රශස්ත ධාරිතාව සහිත වැඩිම නිමැවුම් මට්ටම $Q_2$ වන අතර එම අවස්ථාවෙන් පසු අඩු වන පරිමාණානුකූල ඵල හට ගනී.
2. ප්‍රශස්ත ධාරිතාව සහිත වැඩිම නිමැවුම් මට්ටම $Q_1$ වන අතර එම අවස්ථාවෙන් පසු ස්ථාවර පරිමාණානුකූල ඵල හට ගනී.
3. A කොටසේදී හීනවන ඵලදා නීතිය පෙන්නුම් කරන අතර C කොටසේදී පරිමාණානුකූල පිරිමැසුම් පෙන්නුම් කරයි
4. B කොටසේදී ස්ථාවර පරිමාණානුකූල ඵල පෙන්නුම් කරන අතර A කොටසේදී අඩුවන පරිමාණානුකූල ඵල පෙන්නුම් කරයි.
5. $Q_1$ - $Q_2$ අතර නිමැවුම් ප්‍රමාණය ස්ථාවර අගයක් ගනී.

18. මුළු අයභාරය රු. 1000 කි . ඒකකයක සාමාන්‍ය විචල්‍ය පිරිවැය ( AVC ) රු.6 කි. නිමැවුම් ඒකක සංඛ්‍යාව 100 කි . ආර්ථික බදු කුලිය හා සංක්‍රාම ඉපැයීම අනුපිළිවෙලිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

| | | |
|---|---|---|
| 1. රු.600 , රු.1000 | 2. රු400 , රු.600 | 3. රු.1000 , රු.400 |
| 4. රු.100 , රු.1000 | 5. රු.6000 , රු.600 | |

19. අදාළ රටේ නේවාසික භාවය තහවුරු <u>නොවන</u> ප්‍රකාශය තෝරන්න.

1. වසරකට වඩා අඩු කාලයක් විදේශ සේවයේ නිරත වූවකු
2. ගුවන් යානාවක සේවය කරන කාර්යමණ්ඩල සාමාජිකයෙක්
3. වසර 5 ක කාලයක් අදාළ රටේ අධ්‍යාපන කටයුතු වල නිරත වෙනත් රටක ශිෂ්‍යයෙක්
4. ආර්ථික ප්‍රදේශ තුළ සිටින ජාත්‍යන්තර හා බහු ජාතික ආයතන වල සේවය කරන ස්වදේශික කාර්ය මණ්ඩලය
5. වසරකට වඩා අඩු කාලයක් විදේශයක ජීවත්වන කලාකරුවෙක්

20.

| අයිතමය | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|
| මූල්‍ය නොවන අංශය | 50 |
| මූල්‍ය අංශය | 20 |
| රාජ්‍ය අංශය | 30 |
| ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව | |
| ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය | 70 |
| විදේශ ප්‍රාථමික ශුද්ධ ආදායම | 10 |
| භාණ්ඩ හා සේවා මත අයකරන බදු | 08 |
| සහනාධාර | 04 |

මූලික මිල ගණන් අනුව සමස්ත එකතුකළ අගය සහ වෙළෙඳපොළ මිල අනුව දළ ජාතික ආදායම පිළිවෙලින් දැක්වෙන්නේ

| | | |
|---|---|---|
| 1. රු.මි. 170 , රු.මි. 180 | 2. රු.මි. 170 , රු.මි. 184 | 3. රු.මි. 100 , රු.මි. 184 |
| 4. රු.මි. 180 , රු.මි. 170 | 5. රු.මි. 170 , රු.මි. 190 | |

22 A/L අපි [ papers group ]



21. නිෂ්පාදනය මත ලබාදෙන වෙනත් සහනාධාරයක් නොවන්නේ,
    1. පරිසර දූෂණය අවම කිරීමට ලබාදෙන සහනාධාර
    2. රැකියා ප්‍රවර්ධනය දිරිමත් කිරීම සඳහා ලබා දෙන සහනාධාර
    3. ප්‍රතිචක්‍රීකරණය සඳහා ලබාදෙන සහනාධාර
    4. තේ පොල් රබර් වැනි බෝග සඳහා ලබා දෙන මූල්‍ය සහනාධාර
    5. ආයතනයේ සේවක සංඛ්‍යාව මත ලබාදෙන සහනාධාර

22. අතරමැදි පරිභෝජනය (IC) රු.මි. 480 කි. දළ නිමැවුම (GVO) රු.මි. 800කි. ශුද්ධ බදු රු.මි. 100කි. ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය රු.මි. 40කි.මැදි වසර ජනගහනය මිලියන 20 කි. ශුද්ධ දේශීය නිෂ්පාදිතය හා ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය වන්නේ,
    1. රු.මි. 380 , රු.මි. 20
    2. රු.මි. 280 , රු.මි. 19
    3. රු.මි. 480 , රු.මි. 19
    4. රු.මි. 480 , රු.මි. 29
    5. රු.මි. 380 , රු.මි. 21

23. කිසියම් ආර්ථිකයක ඉතුරුම් ශ්‍රිතය $S = -200 + 0.25yd$ ලෙස වේ. මෙම ආර්ථිකයේ වැය කළ හැකි දළ ජාතික ආදායම රු.මි. 480 කින් ඉහළ යයි නම් පරිභෝජන වියදමේ සිදුවන වැඩිවීම කොපමණ ද?
    1. රු.මි. 120 කි.
    2. රු.මි. 220 කි.
    3. රු.මි. 260 කි.
    4. රු.මි. 280 කි.
    5. රු.මි. 270 කි.

24. එක්තරා සරල ආර්ථිකයක ගුණකය 4 ක් වේ. ආදායමේ ස්වායත්ත පරිභෝජනය රු.මි. 300ක් නම් පරිභෝජනය හා ඉතුරුම් ශ්‍රිත වන්නේ
    1. $c = 300 + 0.2y$, $s = -300 + 0.8y$
    2. $c = 300 + 0.75y$, $s = -300 + 0.25y$
    3. $c = 50 + 0.5y$, $s = -500 + 0.5y$
    4. $c = -300 + 0.75y$, $s = 300 + 0.25y$
    5. $c = 100 + 0.9y$, $s = -100 + 0.1y$

25. එක්තරා ආර්ථිකයක පහත තොරතුරු ඔබට ලබා දී ඇත.

| | |
|---|---|
| ආයෝජන (I) | රු.මි. 200 |
| බදු (T) | රු.මි. 40 |
| රජයේ වියදම (G) | රු.මි. 400 |
| පරිභෝජන ශ්‍රිතය | $c = 250 + 0.8yd$ |

රජයේ බදු සහ රජයේ වියදම් යන දෙකම රු.මි. 80 කින් වැඩි කිරීමට තීරණය කළහොත් සමතුලිත ජාතික නිමැවුමට කුමක් සිදුවේද?
    1. රු.මි. 120 කින් ඉහළ යයි.
    2. රු.මි. 17 කින් වැඩි වේ.
    3. රු.මි. 80 කින් ඉහළ යයි
    4. වෙනසක් සිදු නොවේ.
    5. රු.මි. 80 කින් පහළ යයි.

26. සංචිත අවශ්‍යතාව 40% සහිත එක්තරා බැංකු පද්ධතියක් තුළ රුපියල් මිලියන 200 ක අධි සංචිත පවතී නම් එම බැංකු පද්ධතියට මුදල් සැපයුම උපරිම වශයෙන් ප්‍රසාරණය කිරීමට හැකිවනුයේ,
    1. රු.මි. 40 කිනි.
    2. රු.මි. 200 කිනි.
    3. රු.මි. 600 කිනි
    4. රු.මි. 250 කිනි.
    5. රු.මි. 500 කිනි.

27. ව්‍යාවහාර මුදල් ළඟ තබා ගැනීම සඳහා මහජනතාවගේ ඇති කැමැත්ත අඩු වුවහොත් එය බැංකු පද්ධතිය කෙරෙහි කෙබඳු බලපෑමක් ඇති කරනුයේද?
    1. ද්‍රවශීල වත්කම් ඉහළ නංවා ගැනීම බැංකු වලට ඇති හැකියාව අඩු වනු ඇත.
    2. බැංකු විසින් අය කරනු ලබන පොලී අනුපාත පහළ දැමීමට ඇති හැකියාව වැඩි වනු ඇත.
    3. ඉපැයීම් වත්කම් ඉහළ නංවා ගැනීමට බැංකු වලට ඇති හැකියාව අඩු වනු ඇත.
    4. ණය සැපයුම ප්‍රසාරණය කිරීමට බැංකු වලට ඇති හැකියාව වැඩි වනු ඇත.
    5. ණය සැපයුම ප්‍රසාරණය කිරීමට බැංකු වලට ඇති හැකියාව අඩු වනු ඇත.

28. මහා බැංකුව විසින් විවෘත වෙළෙඳපොළෙහි ආණ්ඩුවේ සුරැකුම්පත් අලෙවි කරනු ලැබුවහොත්
1. බැංකු වල සංචිත අඩු වන අතර පදනම් මුදල් ප්‍රමාණය ද අඩුවේ.
2. බැංකු වල සංචිත වැඩි වන අතර පදනම් මුදල් ප්‍රමාණය ද වැඩිවේ.
3. බැංකු වල සංචිත අඩු වන අතර පදනම් මුදල් ප්‍රමාණය වැඩිවේ.
4. බැංකු වල සංචිත වැඩි වන අතර පදනම් මුදල් ප්‍රමාණය අඩුවේ.
5. බැංකු වල සංචිත වැඩි වන අතර බැංකු සතුව අධි සංචිත පවතීනම් මුදල් සැපයුම අඩු වනු ඇත.

29. වාණිජ බැංකු පද්ධතිය සතු අවශ්‍ය සංචිත ප්‍රමාණය රුපියල් බිලියන 300ක් ද තැන්පතු ප්‍රමාණය රුපියල් බිලියන 1600 ක් ද මහජනයා සතු ව්‍යාවහාර මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 400 ද වේ යැයි සලකන්න. මෙම තත්වය යටතේ මුදල් ගුණකය වන්නේ,
1. 3.33 කි. 2. 2.86 කි. 3. 0.85 කි. 4. 2.76 කි. 5. 2.95 කි.


30. තෝරාගත් ආර්ථික විචල්‍ය කිහිපයක් දර්ශක වශයෙන් පහත සඳහන් වගුවෙහි පෙන්නුම් කෙරේ.

| වර්ෂය | මුදල් තොග (M) | සංසරණ වේගය (V) | මිල මට්ටම (P) | ගණුදෙනු ප්‍රමාණය(T) |
|---|---|---|---|---|
| පළමු වර්ෂය | 200 | 200 | 200 | 200 |
| දෙවන වර්ෂය | 240 | ? | 200 | 160 |

දෙවන වර්ෂයේ සංසරණ ප්‍රවේගය (V) ට අදාළ දර්ශකය කුමක්ද ?
1. 133.45 2. 180 3. 280 4. 133.33 5. 140.32

31. අර්ධ පොදු භාණ්ඩයක ලක්ෂණයකි.
1. පරිභෝජනය සීමා කළ හැකි වීම.
2. ධාරිතා මට්ටම උපරිමය කරා ළගා වන තුරු පරිභෝජනයේ තරගකාරීත්වයක් දක්නට ලැබීම.
3. ගෙවීමක් නොකරන පුද්ගලයන් අදාළ භාණ්ඩ පරිභෝජනයෙන් ඉවත් කළ නොහැකි වීම.
4. පරිභෝජනයේ තරගකාරීත්වයක් කිසිසේත්ම දක්නට නොලැබීම.
5. එම භාණ්ඩ වලින් ලැබෙන ප්‍රතිලාභ ලොව පුරා සිටින සියලුම දෙනාට භුක්ති විදීමට හැකි වීම.

32.




ඉහත රූපසටහනට අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. පරිභෝජනයේ සෘණ බාහිරතාවයක් සහ ඌණ පරිභෝජනයක් පෙන්නුම් කරයි.
2. පරිභෝජනයේ ධන බාහිරතාවයක් සහ අධි පරිභෝජනයක් පෙන්නුම් කරයි.
3. පරිභෝජනයේ සෘණ බාහිරතාවයක් සහ අධි පරිභෝජනයක් පෙන්නුම් කරයි.
4. නිෂ්පාදනයේ සෘණ බාහිරතාවයක් සහ අධි පරිභෝජනයක් පෙන්නුම් කරයි.
5. නිෂ්පාදනයේ ධන බාහිරතාවයක් සහ ඌණ පරිභෝජනයක් පෙන්නුම් කරයි.

33. සංකෝචනාත්මක අයවැය ප්‍රතිපත්ති පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
1. රජය මහ බැංකුවෙන් ණය ලබා ගැනීම හා වාණිජ බැංකු වලින් ණය ලබා ගැනීම
2. රජය ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ණය ලබා ගැනීම හා මහ බැංකුවෙන් ණය ලබා ගැනීම.
3. රජය සේවක අර්ථසාධක අරමුදලින් ණය ලබා ගැනීම හා වාණිජ බැංකු වලින් ණය ලබා ගැනීම
4. රජය මහජනතාවගෙන් ණය ලබා ගැනීම හා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ණය ලබා ගැනීම.
5. රජය මහජනතාවගෙන් ණය ලබා ගැනීම හා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ණය ලබා ගැනීම.

34. 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මුළු බදු ආදායමෙන් සෘජු බදු සහ වක්‍ර බදු ආදායමේ දායකත්වය ප්‍රතිශතයක් ලෙස නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
1. සෘජු බදු 22.1% , වක්‍ර බදු 77.9%
2. සෘජු බදු 18% , වක්‍ර බදු 82%
3. සෘජු බදු 11% , වක්‍ර බදු 89%
4. සෘජු බදු 21.5% , වක්‍ර බදු 79.5%
5. සෘජු බදු 14.1% , වක්‍ර බදු 85.9%

35. ප්‍රාග්ධන වෙළඳපොළ ප්‍රතිසංස්කරණයක් ලෙස සැලකිය හැක්කේ
1. ඒ ඒ වෘත්තීන් සඳහා පුහුණු වීම් පිළිබඳ දැනුවත් කිරීම.
2. නියාමනහරණය.
3. නිෂ්පාදිත වල ගුණාත්මක තත්වය ඉහළ නැංවීම.
4. සහනදායී කොන්දේසි මත විදේශ ණය ලබා ගැනීම.
5. වඩා ඵලදායී ලෙස නිෂ්පාදන සම්පත් නිෂ්පාදන කටයුතු වලට යොදා ගැනීම.

36. A සහ B යන රටවල් දෙක ඔරලෝසු හා රූපවාහිනි යන භාණ්ඩ වර්ග දෙක නිපදවන බවත් එක් එක් රටට නිපදවිය හැකි ප්‍රමාණයන් පහත වගුවේ දැක්වේ.

| භාණ්ඩ වර්ගය | A රට | B රට |
|---|---|---|
| ඔරලෝසු | 16 | 8 |
| රූපවාහිනි | 48 | 40 |

එක් එක් රට තමන්ට සාපේක්ෂ වාසිය සහිත භාණ්ඩය විශේෂීකරණය කරන බවත් දෙරටම වාසිදායක විදේශ වෙළෙඳාමට ප්‍රවේශ වීම තුළින් වාසි අත් කර ගැනීමට නම් ඔරලෝසු හා රූපවාහිනි හුවමාරුව සිදු විය යුතු අනුපාතය කුමක් ද?
1. එක් ඔරලෝසුවක් සඳහා රූපවාහිනි 48 කට අඩු ප්‍රමාණයක්
2. එක් ඔරලෝසුවක් සඳහා රූපවාහිනි 3ට වැඩි සහ 5ට අඩු ප්‍රමාණයක්
3. එක් ඔරලෝසුවක් සඳහා රූපවාහිනි 0.2ට වැඩි සහ 0.33ට අඩු ප්‍රමාණයක්
4. එක් ඔරලෝසුවක් සඳහා රූපවාහිනි 40-48 අතර ප්‍රමාණයක්
5. එක් ඔරලෝසුවක් සඳහා රූපවාහිනි 0.2ට වැඩි 5ට අඩු ප්‍රමාණයක්

37. රටක භාණ්ඩ වෙළඳ අනුපාතයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.
භාණ්ඩ වෙළෙඳ අනුපාතය 90% , ආනයන මිල දර්ශකය 110යි.
අපනයන මිල දර්ශකය වන්නේ
1. 80 2. 90 3. 120 4. 99 5. 89

38. පහත සඳහන් තොරතුරු ඇසුරින් සඵල ආරක්ෂණ අනුපාතය ගණනය කරන්න.
නිර්බාධ වෙළෙඳ තත්වයක් යටතේ දේශීය භාණ්ඩයේ වෙළෙඳපොළ මිල රු.3000
ආනයනික යෙදවුම් පිරිවැය රු.500
ආයානික යෙදවුම් මත පනවා ඇති තීරු බද්ද 5%
ආනයනික නිමි භාණ්ඩ මත පනවා ඇති තීරු බද්ද 20%
1. 25% 2. 17.5% 3. 23% 4. 26% 5. 20%

39. විශේෂ ගැනුම් හිමිකම් ( SDR) ඇතුලත් වන්නේ ගෙවුම් ශේෂ ලේඛනයේ,

1. මූල්‍ය ගිණුමේ අනෙකුත් ආයෝජන තුලය
2. මූල්‍ය ගිණුමේ මූල්‍ය ව්‍යුත්පන්න යටතේ ය.
3. මූල්‍ය ගිණුමේ කළඹ ආයෝජන යටතේ ය.
4. මූල්‍ය ගිණුමේ සංචිත වත්කම් වශයෙනි.
5. මූල්‍ය ගිණුමේ සෘජු ආයෝජන යටතේ ය.

40. ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ වල මූල්‍ය ස්ථායිතාව පවත්වාගෙන යාම පහත සඳහන් කවර ආයතනයක කාර්යභාරයක් ද?

1. ලෝක බැංකුව
2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
3. ආසියානු සංවර්ධන බැංකුව
4. ලෝක වෙළඳ සංවිධානය
5. යුරෝපා සංගමය

41. ඩොලරය හා රුපියල අතර නාමික විනිමය අනුපාතය $ 1=රු. 290 ක සිට $ 1=රු. 350 දක්වා වෙනස් වුයේ නම් එවිට,

1. ඇමරිකානුවන්ට ශ්‍රී ලංකාවේ භාණ්ඩ වල මිල අඩුවන අතර ශ්‍රී ලංකාවෙන් ඇමරිකාවට ආනයනය කෙරෙන භාණ්ඩ ප්‍රමාණය පහළ වැටෙනු ඇත.
2. ඇමරිකානුවන්ට ශ්‍රී ලංකාවේ භාණ්ඩ වල මිල අධික වන අතර ශ්‍රී ලංකාවෙන් ඇමරිකාවට අනානයනය කෙරෙන භාණ්ඩ ප්‍රමාණය පහළ වැටෙනු ඇත.
3. ඇමරිකානුවන්ට ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම වාසි දායක වන අතර ශ්‍රී ලංකිකයන්ට ඇමරිකාවේ සංචාරය කිරීම අවාසි දායක වේ.
4. ඇමරිකානුවන්ට ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම අවාසි දායක වන අතර ශ්‍රී ලංකිකයන්ට ඇමරිකාවේ සංචාරය කිරීම වාසි දායක වේ.
5. ඩොලරයේ අගය රුපියලට සාපේක්ෂව ක්ෂය වී ඇත.

42. රජයේ විදේශීය වත්කම් එ .ජ .ඩො මිලියන 400 කි.

මහා බැංකුවේ විදේශීය වත්කම් එ .ජ .ඩො මිලියන 7000 කි.

තැන්පතු භාරගන්නා ආයතන වල විදේශීය වත්කම් එ .ජ .ඩො මිලියන 2400 කි.

සංචිත වලට අදාල වගකීම් එ.ජ.ඩො මිලියන 1300 කි.

ඉහත දත්ත වලට අනුව ශුද්ධ ජාත්‍යන්තර සංචිත වල අගය වන්නේ,

1. එ .ජ .ඩො 8100 කි.
2. එ .ජ .ඩො 500 කි.
3. එ .ජ .ඩො 4700 කි.
4. එ .ජ .ඩො 6100 කි.
5. එ .ජ .ඩො 9400කි.

43. 2011 සිට 2020 පසුගිය වසර දහය තුළ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ආර්ථික වර්ධන වේගය,

1. 1.96% කි.
2. 4.07 % කි.
3. 4.68% කි.
4. 6% කි.
5. 5.6% කි.

44. 2020 වර්ෂයේ ගෝලීය තරඟකාරීත්වය පිළිබඳ දර්ශකය අනුව ශ්‍රී ලංකාවට හිමි ස්ථානය සහ එහි ප්‍රශස්ත මට්ටම හිමි කර ගත් රට අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. 99 ස්ථානය , නවසීලන්තය
2. 84 ස්ථානය , සිංගප්පූරුව
3. 94 ස්ථානය , ඩෙන්මාර්කය
4. 84 ස්ථානය , නවසීලන්තය
5. 94 ස්ථානය , සිංගප්පූරුව

45. තිරසාර සංවර්ධනයට අදාල සමාජීය පැතිකඩෙහි අරමුණක් නොවන්නේ,

1. සාධාරණත්වය
2. සහභාගිත්වය
3. සමාජ සංචලතාවය
4. සවිබල ගැන්වීම
5. මිනිසුන්ට හිතකර සනීපාරක්ෂක පරිසරය

46. මෑත කාලීනව පහළ මැදි ආදායම් ලබන රටවල් සඳහා ජාත්‍යන්තර දරිද්‍රතා ඉම දිනකට එ .ජ .ඩො

1. 5.48 කි.
2. 21.7 කි.
3. 4.2 කි.
4. 20.8 කි.
5. 3.2 කි.

47. Z නැමැති රටේ ප්‍රජා විද්‍යාත්මක දත්ත සමහරක් පහත දැක්වේ.

| අයිතමය | සංඛ්‍යාව ( මිලියන ) |
|---|---|
| මුළු ජනගහනය | 360 |
| ජනගහනය( අවුරුදු 10 හා ඉහළ) | 300 |
| සේවා නියුක්ත ජනගහනය | 162 |
| සේවා වියුක්ත ජනගහනය | 18 |
| ආර්ථික වශයෙන්ඉ සක්‍රීය නොවන ජනගහනය | 60 |

ඉහත තොරතුරු වලට අනුව Z නැමැති රටේ සේවා නියුක්ත අනුපාතිකය සහ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ

| | සේවා නියුක්ත අනුපාතිකය | ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාත |
|---|---|---|
| 1. | 90.00% | 60.00% |
| 2. | 90.00% | 33.33% |
| 3. | 5.45% | 50.00% |
| 4. | 5.65% | 53.45% |
| 5 | 6.67% | 50.00% |

48. 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාතය අඩුම හා වැඩිම දිස්ත්‍රික්ක දෙක අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. කොළඹ , මුලතිව්
2. කළුතර , කිලිනොච්චිය
3. මන්නාරම , මඩකලපුව
4. ත්‍රිකුණාමලය ,මාතර
5. ගම්පහ , මඩකලපුව

49. 1970 -1977 කාලය තුළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ ආර්ථික සංවර්ධන ප්‍රතිපත්තිය හැඳින්විය හැක්කේ

1. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය
2. සීමිත ප්‍රමාණයක නිර්බාධ ආර්ථික ප්‍රතිපත්තිය
3. සංවෘත ආර්ථිකය සමඟ අනායන ආදේශන කාර්මීකරණය
4. වෙළෙඳපොළ කේන්ද්‍රිය සංවර්ධන ප්‍රතිපත්තිය
5. බාහිරාභිමුඛ අපනයන ප්‍රවර්ධන ප්‍රතිපත්තිය

50. දූෂණ සංජානන දර්ශකය (2020) අනුව රටවල් 180 අතුරින් ශ්‍රී ලංකාවට හිමි ස්ථානය වන්නේ

1. 99 වන ස්ථානය
2. 84 වන ස්ථානය
3. 95 වන ස්ථානය
4. 126 වන ස්ථානය
5. 94 වන ස්ථානය

22 A/L අපි [ papers group ]

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** | 21 | S | II |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022

# උපකාරක ප්‍රශ්න පත්‍ර

**විෂයය - ආර්ථික විද්‍යාව** | **පත්‍රය - II** | කාලය : පැය තුනයි.

උපදෙස්:-

✹ "අ" උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, "ආ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

22 A/L අපි [ papers group ]

## "අ" උප කොටස

(01) (i) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගන්නා ස්වාභාවික සම්පත් වර්ග කරන්නේ කෙසේද? නිදර්ශන යොදාගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ii) නිෂ්පාදන සාධකයක් වශයෙන් ප්‍රාග්ධනය නැමැති නිෂ්පාදන සාධකයේ ආර්ථික වැදගත්කම දක්වන්න. (ලකුණු 4)

(iii) ප්‍රාග්ධන භාණ්ඩ හා පාරිභෝගික භාණ්ඩ නිපදවන ආර්ථිකයක පාරිභෝගික භාණ්ඩ පමණක් නිපදවන විට භාණ්ඩ ඒකක 150ක් ද, ප්‍රාග්ධන භාණ්ඩ පමණක් නිපදවන විට භාණ්ඩ ඒකක 100ක් ද නිපදවිය හැකිය. මෙහි "A" නම් ලක්ෂ්‍යයේදී පාරිභෝගික භාණ්ඩ 100ක් සහ ප්‍රාග්ධන භාණ්ඩ ඒකක 45ක් නිපදවන අතර "B" නම් ලක්ෂ්‍යයේදී පාරිභෝගික භාණ්ඩ 50ක් සහ ප්‍රාග්ධන භාණ්ඩ ඒකක 75ක්ද නිපදවයි.

අ. මෙම ආර්ථිකයේ නිශ්පාදන හැකියා මායිමේ ස්වාභාවය පිළිබඳව ඔබට කුමක් කිව හැකිද? ඒ සඳහා බලපාන ලද හේතු දක්වන්න (ලකුණු 2)

ආ. "මෙම ආර්ථිකය "A" නම් ලක්ෂයේදී පමණක් ආර්ථික කාර්යක්ෂමතාවය අත්කරගෙන සිටී." මෙම ප්‍රකාශයේ වලංගුතාවය විමසන්න. (ලකුණු 2)

(iv) ආර්ථික පද්ධති විවිධ නිර්ණායක ඔස්සේ වර්ග කළ හැකිය. එම නිර්නායක අනුව ආර්ථික පද්ධති වර්ගීකරණය කරන්නේ කෙසේද? (ලකුණු 4)

(v) සමාජයීය වෙළඳපොළ ආර්ථිකය සහ සමාජවාදී වෙළඳපොළ ආර්ථිකය අතර දැකිය හැකි වෙනස්කම් මොනවාද? (ලකුණු 4)

(02) (i) "සඵල ඉල්ලුම" යන්න පැහැදිලි කරන්න. (ලකුණු 3)

(ii) තරගකාරී වෙළෙඳපොළක් සමතුලිතතාවයේ පවතින විට සැපයුමේ වෙනසක් සිදු නොවන අතර භාණ්ඩයේ මිල ඉහලයයි. මේ සඳහා බලපෑහැකි සාධක හතරක් නම් කරන්න. (ලකුණු 4)

(iii) "X" භාණ්ඩයේ මිල අඩුවන විට විකුණුම් අයභාරය අඩුවේ. "Y" භාණ්ඩයේ මිල අඩුවන විට විකුණුම් අයභාරය වැඩි විය. "Z" භාණ්ඩයේ මිල අඩු හෝ වැඩි වුවද විකුණුම් අයභාරයේ වෙනසක් සිදු නොවුනි. මෙවැනි වෙනසකට බලපාන ලද හේතු දක්වා, එය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iv) එක්තරා වෙළඳපොළකට අදාල ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

ඉල්ලුම් සමීකරණය Qd = 600 - 30p

සැපයුම් සමීකරණය Qs = -200 + 20p වේ.

අ.) මිල රුපියල් 15දී ඉල්ලුම් නම්‍යතාවයත්, අධි ඉල්ලුමත් ගණනය කරන්න. (ලකුණු 2)

ආ.) මෙහි සමතුලිත මිල රුපියල් දෙකකින් ඉහළ යන්නේ නම් පාරිභෝගික අතිරික්තය කොපමණද? (ලකුණු 3)

(v) භාණ්ඩයක වෙළඳපොළ සමතුලිත මිල පමණක් වෙනස් වුවද සමතුලිත ප්‍රමාණයේ වෙනසක් සිදු නොවුණි. මෙවැනි අවස්ථා 2ක් රූප සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

03. i. උපරිම මිල හා කළුකඩ මිල යන සංකල්ප හඳුන්වන්න. (ලකුණු 4)

ii. ''නිෂ්පාදකයන් මත පනවනු ලබන ඒකක බද්දක ප්‍රතිවිපාක, ගැණුම්කරුවන් මත පනවනු ලබන ඒකක බද්දක ප්‍රතිවිපාක වලට වඩා වෙනස් වේ.'' මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද ? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. තරගකාරී වෙළඳපොළක ඉල්ලුම් ශ්‍රිතය Qd = 100 - 4p සමීකරණයෙන් ද සැපයුම් ශ්‍රිතය Qs = -30 + 6p සමීකරණයෙන් ද දක්වේ. මෙම වෙළඳපොළෙහි නිෂ්පාදකයන් සඳහා රු. 5 ක ඒකක සහනාධාරයක් ලබා දීමට රජය තීරණය කර ඇතැයි සලකන්න.

අ) මෙම සහනාධාරය ලබා දීම සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණ ද ? (ලකුණු 2)

ආ) සහනාධාරය ලබා දීම නිසා නිෂ්පාදන අතිරික්තයක් සහ පාරිභෝගික අතිරික්තයේ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 4)

ඉ) සහනාධාරය නිසා සමාජ සුභසාධනයට වන බලපෑම කොපමණ ද ? (ලකුණු 2)


iv. ස්වාරක්ෂක තොග ප්‍රතිපත්තියේ අවාසි හතරක් දක්වන්න. (ලකුණු 4)

04. i. හීනවන ආන්තික ඵලදා නීතිය හඳුන්වා එයට පදනම් වන උපකල්පන දක්වන්න. (ලකුණු 4)

ii. 'ආරෝපිත පිරිවැය' නිදසුන් සහිතව පැහැදිලි කර නිෂ්පාදන ආයතනයක ආරෝපිත පිරිවැය ආවස්ථික පිරිවැයෙන් වෙනස් වන්නේ කෙසේද ? (ලකුණු 4)

iii. 'පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක ආන්තික අයභාරය (MR) සාමාන්‍ය අයභාරය (AR) අන්‍යෝන්‍ය වශයෙන් සමාන වේ.' මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. පූර්ණ තරඟකාරී වෙළඳපොළක කෙටි කාලීන සමතුලිතයට අදාළ රූප සටහනක් පහත දක්වා ඇත.




අ) මෙම රූප සටහනට අනුව නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 2)

ආ) සමතුලිත නිමැවුම් මට්ටමේ දී ආර්ථික ලාභය කොපමණ ද ? (ලකුණු 2)

v. මුළු සාධක ඉපයුම් ආර්ථික බදු කුලියෙන් පමණක් සමන්විත වන අවස්ථාවක් සහ මුළු ඉපයුම් සංක්‍රාම ඉපයුම්වලින් පමණක් සමන්විත වන අවස්ථාවක් රූප සටහන් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 4)

05\. i. දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය අතර ඇති ප්‍රධාන වෙනස්කම් දෙකක් දක්වන්න. (ලකුණු 2)

ii. විවිධ අංශ විසින් කරනු ලබන පහත සඳහන් වියදම් දළ දේශීය නිෂ්පාදිතයේ කුමන වියදම් යටතට අයත් වේද යන්න සඳහන් කරන්න.

අ) විදේශ රටවලින් කුටුම්භ වෙත ලැබෙන ත්‍යාග

ආ) රජය විසින් අධ්‍යාපන කටයුතු සඳහා දරණ වියදම

ඉ) දුම්රිය සහ මහාමාර්ග ඉදිකිරීම් සඳහා රජය දරණ වියදම

ඊ) යන්ත්‍ර සූත්‍ර මිල දී ගැනීම සඳහා ව්‍යාපාරික අංශය කරන ලද වියදම් (ලකුණු 4)

iii. කල්පිත ආර්ථිකයකට අදාළ ජාතික ගිණුම් දත්ත පහත දක්වේ. (සියළුම සංඛ්‍යා රුපියල් බිලියන වලින්)

| | |
|---|---|
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 300 |
| නිෂ්පාදනය මත වෙනත් බදු සහනාධාර | 250 |
| සේවක ආදායම් | 180 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම් | 200 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 150 |
| ශුද්ධ විදේශ වර්තන සංක්‍රාම | 90 |
| භාණ්ඩ හා සේවා මත අයකරන බදු සහනාධාර | 300 |
| මිශ්‍ර ආදායම් | 200 |

පහත සඳහන් සංකල්ප වල අගය ගණනය කරන්න.

අ) දළ මෙහෙයුම් අතිරික්තය

ආ) මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය

ඉ) වෙළෙඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදනය

ඊ) වැය කළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 4)

iv. එක්තරා ආර්ථිකය ජාතික ආදායම සම්බන්ධ තොරතුරු පහත දක්වේ.

| | |
|---|---|
| රජයේ වියදම් | 500 |
| ආයෝජනය | 325 |
| පරිභෝජනය | 0.8 Yd |
| ස්වාධීන පරිභෝජනය | 250 |
| බදු | 150 |

අ) සමාහාර නිමැවුමේ සමතුලිත අගය ගණනය කරන්න. (ලකුණු 2)

ආ) ඉහත ආර්ථිකයේ කාන්දුවීම් වල අගය කොපමණ ද ? (ලකුණු 2)

ඉ) රජයේ වියදම සහ ස්වාධීන බදු මිලියන 100 කින් වැඩිකළ විට සමතුලිත ජාතික ආදායමේ වෙනස දක්වන්න. (ලකුණු 2)

v. සුදුසු ප්‍රස්තාර සටහනක් ආශ්‍රයෙන් උද්ධමනාත්මක පරතරය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

22 A/L අපි [ papers group ]

"ආ" උප කොටස

06\. i. සමපේක්ෂණ මුදල් ඉල්ලුම කෙටියෙන් පැහැදිලි කර, එය පොළී අනුපාතිකයත් සමඟ සම්බන්ධ වන ආකාරය විස්තර කර දක්වන්න. (ලකුණු 4)

ii. 'ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය **ඉතා ඉහළ** අගයක් වාර්තා කරයි.' මෙවන් උද්ධමනයක් ආරම්භ වී එය අඛණ්ඩව පැවතීමට හේතූන් රූපසටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. කිසියම් ආර්ථිකයක වාණිජ බැංකු පද්ධතිය තුළ කටයුතු කරන තනි වාණිජ බැංකුවක ශේෂ පත්‍රයක් පහත දැක්වේ.

| වගකීම් | වටිනාකම (රු. මිලියන) | වත්කම් | වටිනාකම (රු. මිලියන) |
|---|---|---|---|
| තැන්පතු | 120,000 | සංචිත | 20,000 |
| කොටස් ප්‍රාග්ධනය | 30,000 | සුරැකුම්පත් | 30,000 |
| | | ණය | 100,000 |
| මුළු වගකීම් | 150,000 | මුළු වත්කම් | 150,000 |

අ. මෙම බැංකුවේ ගනුදෙනුකරුවෙකු තම ජංගම ගිණුමට රු. මිලියන 5000ක් තැන්පත් කරයි. මෙම මුදල් තැන්පත් කිරීමෙන් පසු බැංකුවේ සංචිත වෙනස්වන ආකාරය දක්වන්න. (ලකුණු 2)

ආ. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% ක් නම් මෙම නව තැන්පතුවෙන් පසු මෙම බැංකුවට ණය උපරිම වශයෙන් කොපමණ ප්‍රමාණයක් වැඩි කළ හැකිද? (ලකුණු 4)

ඇ. මෙම ණය ලබාදීමෙන් පසු බැංකු පද්ධතියේ බිහි කළ හැකි මුළු ණය ප්‍රමාණය කොපමණද? (ලකුණු 2)

iv. ශ්‍රී ලංකා ආර්ථිකය තුළ අධි හෝ ඌන ද්‍රවශීලතා කළමණාකරණය සඳහා විවට වෙළඳපොළ කටයුතු හසුරවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

07. i. රජයක් බදු පැනවීම මගින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත අරමුණු කවරේද? (ලකුණු 4)

ii. 'වෙළඳපොළ බිඳවැටීමක් සිදුවන්නේ සෘණ බාහිරතා මගින් මිස ධන බාහිරතා මගින් නොවේ.' මෙම ප්‍රකාශයේ වලංගුතාව පරීක්ෂා කරන්න. (ලකුණු 4)

iii. සැපයුමේ මිල අනම්‍යතාවක් පවතින විට අධි බදු බර හැසිරෙන ආකාරය සුදුසු රූපසටහනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 4)

iv. රාජ්‍ය වියදම් ඉහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක කවරේද? (ලකුණු 4)

v. 'ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය, රාජ්‍ය අයභාරය සමඟ සැසඳීමේදී ආර්ථිකය මත දැඩි පීඩනයක් ඇති කරයි.' මෙම ප්‍රකාශය දත්ත ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

08. i. A හා B යන රටවල් රෙදි හා මෝටර්රථ නිපදවන්නේ යැයිද, භාණ්ඩ වර්ග දෙකෙන් ඒකකයක් නිපදවීමට යෙදවිය යුතු සම්පත් ප්‍රමාණයන් පහත දැක්වේ.

| රට | රෙදි | මෝටර් රථ |
|---|---|---|
| A | 4 | 2 |
| B | 7 | 5 |

අ. එක් එක් භාණ්ඩය නිපදවීමෙහිලා නිරපේක්ෂ වාසිය අයත් වන්නේ කවර රටකටද? (ලකුණු 2)

ආ. භාණ්ඩ දෙක නිපදවීමේ සාපේක්ෂ වාසිය දෙරට අතර බෙදී ගොස් ඇති ආකාරය දත්ත ඇසුරින් දක්වන්න. (ලකුණු 4)

ii. 'නාමික ආරක්ෂණ අනුපාතයට වඩා සඵල ආරක්ෂණ අනුපාතය තුළින් දේශීය නිෂ්පාදකයාට ලැබෙන සැබෑ ආරක්ෂණය මැනිය හැකිය.' මෙම ප්‍රකාශයේ වලංගුතාවය පරීක්ෂා කරන්න. (ලකුණු 4)

iii. දීර්ඝ කාලයක සිට ශ්‍රී ලංකාව ගෙවුම්ශේෂ අර්බුධයකට මුහුණ පා සිටියි. මෙලෙස ගෙවුම් ශේෂ අර්බුධය සමනය කිරීමට යොදා ගනු ලබන කෙටිකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග සඳහන් කරන්න. (ලකුණු 4)

iv. පහත සඳහන් දේශීය සාධක, පාවෙන විනිමය අනුපාතිකය යටතේ විනිමය අනුපාතිකය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 6)

අ. මූර්ත දළ දේශීය නිෂ්පාදනයේ පහළ වැටීමක්

ආ. උද්ධමන අනුපාතිකයේ ඉහළ යාමක්

09. i. 'ආර්ථික වෘද්ධිය හා තිරසාර සංවර්ධනය එක හා බැඳුනු සංකල්ප වේ.' මෙම ප්‍රකාශයේ වලංගුතාවය පරීක්ෂා කරන්න. (ලකුණු 4)

ii. සංවර්ධන මිනුමක් ලෙස මානව සංවර්ධන දර්ශකයේ ප්‍රබලතා හා දුබලතා සඳහන් කරන්න. (ලකුණු 6)

iii. ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජකයින් ආකර්ශනය කර ගැනීම සඳහා මෙන්ම දේශීය ආයෝජන වලට පහසුකම් සැලසීම සඳහා ද අවධානය යොමු විය යුතු ක්ෂේත්‍රයන් මොනවාද? (ලකුණු 4)

iv. ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය යන්න හඳුන්වා ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතයෙහි මෑතකාලීන ප්‍රවනතා පරීක්ෂා කරන්න. (ලකුණු 6)

10. i. විදේශ සේවා නියුක්තිය හා විදේශ ප්‍රේෂණ ලැබීම් ආර්ථිකය මත ඇති කරන බලපෑම සඳහන් කරන්න. (ලකුණු 4)

ii. 'යටිතල පහසුකම් සංවර්ධනයෙහිලා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව වඩාත් සාර්ථක ක්‍රමවේදයකි.' පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. දැනුම් ආර්ථිකය කෙටියෙන් හඳුන්වා දැනුම් ආර්ථිකයක් වෙත පියමං කිරීමේදී ශ්‍රී ලංකාව මුහුණදෙන අභියෝග දක්වන්න. (ලකුණු 6)

iv. 'Covid-19 තුළින් බලගැන්වුණු නිවසේ සිට රැකියාවේ නිරතවීම.' වැඩසටහනේ වාසි හා අවාසි මොනවාද? (ලකුණු 6)

22 A/L අපි [ papers group ]

01) I. වර්ගීකරණය
- I. ප්‍රතිස්ථාපනය කල හැකි සම්පත්
- II. ප්‍රතිස්ථාපනය කල නොහැකි සම්පත්

(ලකුණු 02)

★ ප්‍රතිශ්ඨාපනය කල හැකි සම්පත් :-
භාවිතයට ගැනීමත් සමඟ විනාශයට පත්වුවද ප්‍රතිජනනය වන සම්පත්.
උදා :- වනසම්පත, මත්ස්‍ය සම්පත් (ලකුණු 01)

★ ප්‍රතිශ්ඨාපනය කල නොහැකි සම්පත් :-
භාවිතයට ගැනීමත් සමඟ ක්ෂයවීමට පත්වන නැවත ඇති කල නොහැකි සම්පත්
උදා :- මිනිරන් , ගෑස් (ලකුණු 01)


II. ප්‍රාග්ධනය යනු නිශ්පාදන ක්‍රියාවලියේ දී යෙදවුමක් ලෙස භාවිතා කරන මිනිසා විසින් නිශ්පාදනය කරන ලද නිශ්පාදන ආධාරකයන්ය. මෙය මූර්ත සංකල්පයකි.
උදා :- යන්ත්‍ර සූත්‍ර (ලකුණු 01)

<u>ආර්ථික වැදගත්කම</u>
- ★ රටක සම්පත් සම්භාරයේ ප්‍රධාන සාධකයක් වීම. එම නිසා රටක නිශ්පාදන ශාක්‍යතාව තීරණය කරන ප්‍රධාන සාධකයක් වීම.
- ★ ආර්ථික වර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන නිර්ණායකයක් වීම.
- ★ අනෙක් නිශ්පාදන සාධක සමඟ සසඳන විට ඉහළ ඵලදායීතාවයෙන් යුක්ත වීම.
- ★ ශ්‍රම ඵලදායීතාවය ඉහළ යාමට හේතු වීම.
- ★ හිමිකරුට අඛණ්ඩව ආදායම් ප්‍රවාහයක් ලබාදීම.
- ★ නිශ්පාදන ක්‍රියාවලිය තුළට නව තාක්ෂණය ප්‍රවේශ වන ප්‍රධාන මාර්ගයක් වීම.

(ඕනෑම කරුණු 3කට ලකුණු 03)

22 A/L අපි [ papers group ]

III. අ.




මෙහි නිශ්පාදන හැකියා මායිමේ ස්වභාවය වැඩෙන ආවස්ථිත පිරිවැය න්‍යායකි. එනම් මෙහි ආවස්ථික පිරිවැය ක්‍රමයෙන් වැඩිවන ස්වභාවයක් දැකිය හැක. (ලකුණු 01)
හේතු :-
- ★ සම්පත් සමජාතීය නොවීම.
- ★ එක් නිශ්පාදනයක් සඳහා කාර්යක්ෂම වන සම්පත් අනෙක් නිශ්පාදනය සඳහා කාර්යක්ෂම නොවීම. (ලකුණු 01)

ආ) මෙම ප්‍රකාශය පිළිගත නොහැක.


★ ආර්ථික කාර්යක්ෂමතාව යනු නිශ්පාදන කාර්යක්ෂමතාව සහ සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව යන දෙකට අත්කරගෙන සිටීමයි.

★ නිශ්පාදන හැකියා මායිම මත පිහිටන ඕනෑම ලක්ෂ්‍යයකින් මෙය පෙන්විය හැකිය. එනම් A හෝ B ලක්ෂ්‍යයන් දෙකෙන්ම නිශ්පාදන කාර්යක්ෂමතාව පෙන්විය හැකිය.

★ එම නිසා A ලක්ෂ්‍යයේදී හෝ B ලක්ෂ්‍යයේදී නිශ්පාදන කාර්යක්ෂමතාව අත්කරගෙන සිටිය ද A ලක්ෂ්‍යයේ ද සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව අත්කරගෙන ඇතැයි ප්‍රකාශ නොවේ.

★ A ලක්ෂ්‍යයේදී නිශ්පාදන කාර්යක්ෂමතාව හා සම්පත් බෙදාවෙන්කිරීමේ කාර්යක්ෂමතාව යන කාර්යක්ෂමතා දෙකම අත්කරගෙන සිටී නම් පමණක් A ලක්ෂ්‍යයේදී ආර්ථික කාර්යක්ෂමතාවය අත් කරගන ඇති බව ප්‍රකාශ කල හැකිය.

(ලකුණු 02)




22 A/L අපි [ papers group ]

IV. **නිර්ණායක :-**

1. තීරණ සම්බන්ධීකරණ යන්ත්‍රණය < වෙළඳපොල ආර්ථික පද්ධති / විධානගත ආර්ථික පද්ධති
2. සම්පත් හිමිකාරිත්වයේ ස්වභාවය < ධනාශ්වර ආර්ථික පද්ධති / සමාජවාදී ආර්ථික පද්ධති
3. සානු බල වල ස්වභාවය < වෙළඳපොල / විධාන

**(ලකුණු 04 යි.)**

V.

| සමාජීය වෙළඳපොල ආර්ථිකය | සමාජවාදී වෙළඳපොල ආර්ථිකය |
|---|---|
| ★ වෙළඳපල ආර්ථික පද්ධතියක් තුළ සමාජ සාධාරණය ඇතිකිරීම සඳහා රජය මැදිහත් වන ආර්ථිකය සමාජයීය වෙළඳපල ආර්ථිකයයි.<br>★ නිශ්පාදන සම්පත් පෞද්ගලික අංශය සතුවේ.<br>★ නිශ්පාදන සම්පත් භාවිතය පිළිබඳ විශාල බලපෑමක් රජය කරයි. | ★ මූලික වශයෙන් සමාජවාදී දර්ශනයක් මත මෙහෙයවන කිසියම් දුරකට වෙළඳපල බලවේග වලට ක්‍රියාත්මක වීමට ඉඩ සලසා ඇති ආර්ථිකය සමාජවාදී වෙළඳපල ආර්ථිකයයි.<br>★ නිශ්පාදන සම්පත් රජය සතුවේ.<br>★ භාවිතය පිළිබඳ තීරණය ගැනීම පෞද්ගලික අංශය සතුයි. |

**(ඕනෑම වෙනස්කම් දෙකකට ලකුණු 04 යි)**

(02) I දෙනලද අවස්ථාවක අනෙකුත් සාධක ස්ථාවරව තිබිය දී යම් භාණ්ඩයක් මිලදී ගැනීමේ වුවමනාව, මිලදී ගැනීමේ හැකියාව හා මිලදී ගැනීමේ සූදානම මත පදනම් වූ ඉල්ලුම සඵල ඉල්ලුමයි. **(ලකුණු 03)**

II.
- ★ආදේශන භාණ්ඩයේ මිල ඉහළ යාම.
- ★අනුපූරක භාණ්ඩයේ මිල අඩුවීම.
- ★පාරිභෝගික ආදායම අඩුවීම.
- ★අනාගත මිල ඉහළ යතැයි අපේක්ෂා කිරීම.
- ★රුචිය වැඩි වීම.

**(ඕනෑම කරුණු හතරතට ලකුණු 04 යි)**

III මෙහිදී අයභාරය මිල වෙනස්වීමත් සමග අඩුවේද වැඩිවේද යන්න තීරණය වනුයේ, ඉල්ලුම් නම්‍යතාවය අනුවය. **(ලකුණු 01)**

x භාණ්ඩයේ මිල අඩුවන විට පැහැදම අඩු වන්නේ අනම්‍ය ඉල්ලුමක් ඇතිවිටය. y භාණ්ඩයේ මිල අඩුවන විට පැහැදම වැඩි වන්නේ නම්‍ය ඉල්ලුමක් ඇතිවිටය. c භාණ්ඩයේ මිල වැඩි/ අඩු වන විට පැහැදම වෙනස් නොවන්නේ ඒකීය ඉල්ලුමක් ඇති විටය. **(අවස්ථා තුනට ලකුණු 03 යි)**

IV.අ) මිල රු.15 දී ඉල්ලුම් නම්‍යතාවය :-

$Qd = 600 - 30 \times 15$ $\quad$ $PED = b \times \frac{p}{4}$

$= 600 - 450$

$= 150$ $\quad$ $PED = -30 \times \frac{15}{150}$

$= -3$ (ලකුණු 01)

මිල රු.15 දී අධි ඉල්ලුම :-

$Qs = -200 + 20 \times 15$ $\quad$ අධි ඉල්ලුම $= 150 - 100$

$= -200 + 300$ $\quad$ $= 50$ (ඒකක)

$= 100$ (ලකුණු 01)

ආ) සමතුලිත මිල රු.16 යි.


රුපියල් දෙකකින් ඉහළ ගිය විට $16 + 2 =$ රු.18 ක් වේ. රුපියල් 18 ක්දී පාරිභෝගික අතිරික්තය.

පාරිභෝගික අතිරික්තය $= \frac{20 - 18 \times 60}{2}$ (සමීකරණයට ලකුණු 01

$=$ රු.60 පිළිතුරට ලකුණු 02)


22 A/L අපි [ papers group ]

v. 1. ඉල්ලුමට වැඩිවන වේගයෙන් සැපයුම අඩු වීම




(ලකුණු 02)

2. ඉල්ලුම අඩුවන වේගයෙන් සැපයුම වැඩිවීම.





(ලකුණු 02)

03) I. උපරිම මිල යනු වෙළඳපල මිල යාන්ත්‍රණය යටතේ තීරණය වූ සමතුලිත මිල පාරිභෝගිකයාට අසාධාරණ වෙතැයි සිතුවිට ඔවුන්ට සාධාරණයක් සැලකීම සඳහා ආණ්ඩුව විසින් නියම කරනු ලබන නීත්‍යානුකූල මිල උපරිම මිල වේ. සමතුලිත මිලට පහළින් උපරිම මිල සීමා නොවේ. (ලකුණු 02)

කළු කඩ මිල යනු උපරිම මිල සීමා පනවනු ලබන විට ඇතිවන අධි ඉල්ලුම හේතුකරගෙන වෙළඳපලේ උපරිමමිල සීමාව ඉක්මවා වෙළඳුන් අයකරගන්නා ලද මිල වේ. එනම් කිසියම් භාණ්ඩ ප්‍රමාණයක් සඳහා උපරිම මිලට වඩා ගැණුම්කරුවන් ගෙවීමට කැමති අතිරේක මිලයි. මෙය නීතිවිරෝධී මිලකි. (ලකුණු 02)

II එකඟ නොවේ.

ගැණුම්කරුවන් මත හෝ විකුණුම්කරුවන් මත ගෙවනු ලබන ඒකක බදු නිසා බදු බරෙහි කිසිදු වෙනසක් ඇති නොවේ.




අවස්ථා දෙකේදීම බද්දට පසු සමතුලිත නිමවුම ඒකක 10 ක් වූ අතර ගැනුම්කරුවන් ගෙවූ මිල රු.7 ක් වන අතර, විකුණුම්කරුවන්ට ලැබුණු මිල රු.5 ක් වේ. (රූප සටහන් ආශ්‍රයෙන් විස්තර කිරීමට ලකුණු 04)

III. අ. රජයේ පිරිවැය ⟶ රුපියල් 300 කි.

(සහනාධාරයෙන් පසු ප්‍රමාණය සෙවීමට ලකුණු 01)

(රජයේ පිරිවැය පිළිතුරට ලකුණු 01)

ආ. නිශ්පාදන අතිරික්තය ගණනය කිරීමට (ලකුණු 02)

නිශ්පාදන අතිරික්තය රු.300 කි.

සහනාධාරය ලබාදීම නිසා පාරිභෝගික අතිරික්තය රු.450 කි. (ලකුණු 02)

ඉ. සමාජ සුභ සාධනයට වන බලපෑම

ආර්ථික අතිරික්තයේ වැඩිවීම ගණනය කිරීමට

සමාජ ශුභ සාධනයට වන බලපෑම :-

රජයේ පිරිවැය - (ආර්ථික අතිරික්තයේ වැයවීම)

300 - (162+108)

300 - 270

= රු.30.00 කි (ලකුණු 02)

iv. ගබඩා කරන පිරිවැයක් දැරීමට සිදුවීම.

- තොග මිලදී ගැනීමට පිරිවැයක් යාම.
- තොග නශ්‍ය වීම.
- ගබඩා පහසුකම් නොමැති වීම. (ලකුණු 04)

04. I. නිශ්පාදන ආයතනයක් කෙටිකාලයේදී ස්ථාවර යෙදවුම් සමඟ මිශ්‍ර කරමින් විචල්‍ය යෙදවුම් පමණක් වැඩි කරන විට, විචල්‍ය යෙදවුම් ආන්තික ඵලදාව සහ සාමාන්‍ය ඵලදාව එක්තරා අවස්ථාවකට පසුව පහළ යෑම හීනවන ආන්තික ඵලදා නීතියයි. (ලකුණු 02)

උපකල්පන :- 1. සියලු විචල්‍ය යෙදවුම් ඒකක සමජාතීය වීම.

2. අදාල නිශ්පාදන ක්‍රියාවලිය තුල තාක්ෂණය නෙවෙනස්ව පැවතීම. (ලකුණු 02)

II. ආරෝපිත පිරිවැය යනු ආයතනයේ හිමිකරුවන් සතු නිශ්පාදන සම්පත් නිශ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිතා කිරීමේදී කැපකිරීමට සිදුවන හොඳම විකල්ප භාවිතයේ වටිනාකමයි. එනම් නිශ්පාදන ක්‍රියාවලියට යොදාගැනෙන ආයතන සතු නිශ්පාදන සම්පත්වල අවස්ථිත පිරිවැයයි. (වක්‍ර පිරිවැය)

උදා :- අහිමි වී ගිය වැටුප් ආදායම

නිශ්පාදකයාට අහිමි වූ පොලී ආදායම

ආර්ථික ක්ෂයවීම.

ප්‍රාමාණික ලාභ (ලකුණු 02)

ආවස්ථික පිරිවැය යනු නිශ්පාදන ක්‍රියාවලියට කැප කරනු ලබන සියලුම සම්පත් වල පිරිවැයයි. මෙයට ඍජු පිරිවැය සහ වක්‍ර පිරිවැය යන පිරිවැය වර්ග දෙකම අයත් වේ. ආර්ථික විද්‍යාවේ ද පිරිවැය ලෙස සලකන්නේ ආවස්ථික පිරිවැය වේ. (ලකුණු 02)

III. අන්තික අයභාරය යනු නිමවුම එක් ඒකකයකින් වැඩිකරන විට ආයතනයේ මුළු අයභාරයට අලුතින් එකතුවන ප්‍රමාණයයි. $MR = \frac{\Delta TR}{\Delta Q}$ (ලකුණු 01)

සාමාන්‍ය අයභාරය යනු මුළු අයභාරය නිමවුම් ඒකක ප්‍රමාණයෙන් බෙදීමෙන් ලබාගත හැක. $AR = \frac{TR}{Q}$

(ලකුණු 01)

පූර්ණ තරඟකාරී ආයතනයක් පැවැරුණු මිලක් යටතේ කටයුතු කරන නිසා අලෙවි ඒකක ප්‍රමාණය වෙනස්වන විට මුළු අයභාරය වැඩිවන්නේ පැවැරුණු මිලට සමාන ප්‍රමාණයකින් බැවින් ඕනෑම අලෙවි ප්‍රමාණයකදී ද ලැබෙන AR සෑමවිටම මිලට සමානවේ. ( P =AR) (ලකුණු 01)

අනෙක් අතට පැවැරුම් මිලක් නිසා අතිරේක ඒකකයක් අලෙවි කිරීම නිසා TR ඉහළ යන්නේ හරියටම මිලට සමාන ප්‍රමාණයකිනි. එම නිසා ඕනෑම නිමවුම් මට්ටමක දී $\frac{\Delta TR}{\Delta Q}$ ලැබෙන ආන්තික අයභාරය මිලට සමාන වේ. (ලකුණු 01)

එම නිසා MR = AR වේ.

$AR = \frac{TR}{Q}$ $\quad$ $MR = \frac{\Delta TR}{\Delta Q}$

$TR = P \times Q$ $\quad$ $MR = \frac{P \times \Delta Q}{\Delta Q}$

$AR = \frac{P \times Q}{Q}$

එම නිසා AR = P $\quad$ එම නිසා MR = P

22 A/L අපි [ papers group ]

සංඛ්‍යා ලේඛන උදාහරණයක් වන්නේ,

| ප්‍රමාණය | මිල | මුළු අයභාරය | සාමාන්‍ය අයභාරය | ආන්තික අයභාරය |
|---|---|---|---|---|
| 0 | 25 | 0 | 0 | - |
| 1... | 25 | 25 | 25 | 25 |
| 2... | 25 | 50 | 25 | 25 |
| 3... | 25 | 75 | 25 | 25 |
| 4... | 25 | 100 | 25 | 25 |
| 5... | 25 | 125 | 25 | 25 |

මිල රු.25 ක් සේ ස්ථාවරව පවතින නිසා එය සාමාන්‍ය අයභාරය ආන්තික අයභාරයට සමාන වේ.


IV අ. නිශ්පාදන අතිරික්තය

TR = 55 x 120 = 6600
TVC = 28 x 120 = 3360
නිශ්පාදන අතිරික්තය = රු.3240 (ලකුණු 02)


ආ. TR = 6600
TC = 5040
π රු.560 (ලකුණු 02)

22 A/L අපි [ papers gro

V.




(ලකුණු 01)




(ලකුණු 01)

1. පූර්ණ අනම්‍ය සාධක සැපයුම
2. පූර්ණ නම්‍ය සාධක සැපයුම

} (ලකුණු 02)

05) I. **ප්‍රධාන වෙනස්කම් :-**

1. ගම්‍ය මිල දර්ශනයට ආයෝජන භාණ්ඩ, භාණ්ඩ හා සේවා වලට අමතරව ආයෝජන භාණ්ඩ, අන්තර් භාණ්ඩ ආදියෙහි මිලෙහි වෙනස්කම් ද නිරූපණය කළත් ජාතික පාරිභෝගික මිල දර්ශකය මගින් ලබන්නේ පරිභෝජන භාණ්ඩ හා සේවාවල මිලෙහි උච්චා වචනයක් පමණක් වීම.

2. ගම්‍ය මිල දර්ශකය ජාතික ගිණුම් ගණනය කිරීමේ අතුරු ඵලයක් වන අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකය මිල ගණන් රැස් කොට ගණනය කරන රටේ නිල මිල දර්ශනයකි.

3. ගම්‍ය මිල දර්ශකයේ පදනම් වර්ෂය 2010 වන අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකයේ පදනම් වර්ෂය 2013 වේ.

**(ඕනෑම කරුණු දෙකකට ලකුණු 02 යි)**

II.අ) කුටුම්භ පෞද්ගලික පරිභෝජන වියදම්
ආ) රජයේ පුද්ගල පරිභෝජන වියදම්
ඉ) රජයේ සමූහ පරිභෝජන වියදම්
ඊ) දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සංගදනය (නිශ්පාදනය නොකළ මූල්‍ය නොවන) (ලකුණු 04)

III.අ) ශුද්ධ මෙහෙයුම් අතිරික්තය - 300
මිශ්‍ර ආදායම් - 200
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය - 150
දළ මෙහෙයුම් අතිරික්තය - රු.650 (ලකුණු 01)

ආ) සේවක ආදායම් - 180
දළ මෙහෙයුම් අතිරික්තය - 650
නිෂ්පාදනය මත වෙනත් බදු සහනාධාර - 250
මූලික මිල අනුව සමස්ථ එකතු කළ අගය - රු.1080 (ලකුණු 01)

ඉ) මූලික මිලට සමස්ත එකතු කළ අගය - 1080
භාණ්ඩ හා සේවා මත අයකරන බදු සහනාධාර - 300
වෙළඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය - රු.බි.1380 (ලකුණු 01)

ඊ) වෙළඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය - 1380
විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම් - 200
වෙළඳ මිල අනුව දළ ජාතික ආදායම - 1580
ශුද්ධ විදේශ වර්තන සංක්‍රාම - 90
වැය කළ හැකි දළ ජාතික ආදායම - රු.බි.1670 (ලකුණු 01)

IV. අ) Y = C + I + G
= 250 + 0.8yd + 325 + 500
= 1075 + 0.8(y-150) (ලකුණු 02)
= 1075 + 0.8y - 120
= 955 + 0.8y
y-0.8y = 955
y = $\frac{955}{2}$ = 4775


ආ) W = S + T
675 + 150
825 (ලකුණු 02)

22 A/L අපි [ papers.g

ඉ) KG = $\frac{1}{1-6}$ = $\frac{1}{0.2}$ = 5
KT = $\frac{-6}{1-6}$ = $\frac{0.8}{0.2}$ = -4 (ලකුණු 01)

ΔY = 5 x 100 + (-4 x 100) (ලකුණු 01)
= 500 + (-100)
= 100

V.




(ලකුණු 02)

$Y_F$ = පූර්ණ සේවා නියුක්ති මට්ටම
$Y_1$ = සාර්ව ආර්ථික සමතුලිත මට්ටම
$E_o$ = පූර්ණ සේවා නියුක්ති මට්ටමට අදාළ සමාහාර වියදම
$E_1$ = පූර්ණ සේවා නියුක්ති මට්ටමට අවශ්‍ය වියදම ඉක්මවා දැනට පවතින සැබෑ සමාහාර වියදම
a-b = මෙම පරතර උද්ධමනාත්මක පරතර වේ.
(ලකුණු 02)

## පිළිතුරු

### 'ආ' කොටස

06) I. පිළිනපත් වල මුදල් ආයෝජනය කිරීමෙන් අනාගත ප්‍රතිලාභ ලබා ගැනීමේ අරමුණින් මුදල් ළඟ තබා ගැනීම, සම්ප්‍රේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම නම් වේ. නැතිනම්, වත්කමක් ලෙස මුදල් ශේෂ ළඟ තබාගැනීම සම්ප්‍රේෂණ මුදල් ඉල්ලුමයි. (ලකුණු 01)


ජනතාව විවිධ වත්කම් ළඟ තබා ගැනීමට පෙළඹෙන අතර, සිය වත්කම් ගොනුවේ මුදල් හා පිළිණපත් අතර, තේරීම් කිරීම් පොලී අනුපාතිකය අනුව සිදුවේ. මේ අනුව පොලී අනුපාතිකය හා වත්කමක් ලෙස මුදලට ඇති ඉල්ලුම අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතී. (ලකුණු 01)

පොලී අනුපාතික ඉහළ යන විට ඊට ප්‍රතිලෝමව තිළිණපත් මිල පහළ යතැයි ජනතාව තුළ අපේක්ෂණයක් ඇති වේ. මේ නිසා තිළිණපත් මිලදී ගැනීමට පෙළඹෙන හෙයින් සම්ප්‍රේෂණ චේතනාව යටතේ මුදලට කරන ඉල්ලුම අඩුවේ. (ලකුණු 01)

පොලී අනුපාතික පහළ යන විට ඊට ප්‍රතිලෝමව තිළිණපත් මිල ඉහළ යතැයි අපේක්ෂණයක් ඇති වේ. මේ නිසා තිළිණපත් විකිණීමට ජනතාව පෙළඹෙන හෙයින් සම්ප්‍රේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම වැඩි වේ. (ලකුණු 01)

II. ශ්‍රී ලංකාවේ ඉතා ඉහල උද්ධමනයක් වර්තමානයේ ඇති වී ඇත. එවැනි උද්ධමනයක් ඇති වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ සමහර ඉල්ලුමේ වර්ධනය වීම තුළින් උද්ධමනය හටගෙන ඇත. ආර්ථිකය තුළ ඇති අති විශාල මුදල් සම්භාරය නිසා මෙලෙස සමහාර ඉල්ලුම ඉහළ ගොස් ඇත. (ලකුණු 01)


22 A/L අපි [ papers gro




(ලකුණු 01)

මෙම උද්ධමනය වර්තමානයේ අඛණ්ඩව පැවතීමට හේතුව වී ඇත්තේ සමහාර ඉල්ලුමේ වර්ධනයත් සමගම සමහාර සැපයුම අඛණ්ඩව සංකෝචනය වීම තුළිනි. ආර්ථිකයේ ඇතිව තිබෙන සැපයුම් කම්පනයක් හේතුවෙන් සමහාර සැපයුම අඩු වී ඇත. එම නිසා උද්ධමනය අඛණ්ඩව පවතී. (ලකුණු 01)

එය පහත රූපයේ පරිදි දැක්විය හැකිය.




(ලකුණු 01)

III. අ) පෙර සංචිත ප්‍රමාණය 20 000

| | |
|---|---|
| පෙර සංචිත ප්‍රමාණය | 20 000 |
| තැන්පතුව කළ පසු සංචිත ප්‍රමාණය | 25 000 |
| සංචිත කළ වෙනස | 5 000 |

(ලකුණු 01)

සංචිත රු. මිලියන 5000 කින් වැඩි වේ. (ලකුණු 01)

ආ) ව්‍යවස්ථාපිත සංචිතය = තැන්පතු x ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය

$125000 \times \frac{10}{100}$ = රු.මි.12 500

අධි සංචිතය = පවත්නා සංචිතය - ව්‍යවස්ථාපිත සංචිතය

= 25 000 - 12 500

= රු. මිලියන 12 500 (ලකුණු 02)

අලුතින් ලබාදිය හැකි ණය ප්‍රමාණය = රු. මිලියන 12 500 (ලකුණු 02)

ඇ) බිහිකළ හැකි මුළු ණය ප්‍රමාණය = ආරම්භක අධි සංචිතය x ණය ගුණකය

= 12500 × 10

= රු.මි.125000 (ලකුණු 01)

ණය ගුණකය $= \frac{1}{Y} = \frac{1}{10/100} = \frac{100}{10} = 10$ (ලකුණු 01)


IV විවට වෙළඳපල කටයුතු යනු, මහ බැංකුව පිළිණපත් විකිණීම් හා මිලදී ගැනීම් සිදුකිරීමයි. ශ්‍රී ලංකා ආර්ථිකය තුළ අධි ද්‍රවශීලතාවක් පවතින විට ශ්‍රී ලංකා මහ බැංකුව විවෘත වෙළඳපොලේ පිළිණපත් අලෙවි කරයි. එවිට වාණිජ බැංකු සංචිත මහ බැංකුව වෙත ඇදී යන අතර, එහි සංචිත අඩු වී ණය දීමේ හැකියාව අඩු වී මුදල් සැපයුම සංකෝචනය වේ. මෙලෙස පිළිණපත් අලෙවි කිරීම තුළින් මහ බැංකුව අධි ද්‍රවශීලතාව අවශෝෂණය කර ගනියි.
ශ්‍රී ලංකා ආර්ථිකය තුල ඌන ද්‍රවශීලතාවක් පවතින විට මහ බැංකුව පිළිණපත් නැවත මිලදී ගනිමින් ආර්ථිකය වෙත ගලා හැරීමක් සිදු කරයි. පිළිණපත් නැවත මිලදී ගන්නා විට මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට සංචිත මුදා හරියි. එවිට වාණිජ බැංකුවල සංචිත ඉහල ගොස් ණය ගලා යාම තුලින් ආර්ථිකයේ හිඟ ද්‍රවශීලතාව කලමනාකරණය වේ. (ලකුණු 04)

(07) I. ආදායම් හා ධනය බෙදීයාමේ විෂමතා අවම කිරීම.
කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සම්පත් කළමනාකරණය කිරීම.
ඉහළ සමාජ පිරිවැයක් දරණ අවගුණ භාණ්ඩ පරිභෝජනය අධෛර්යමත් කිරීම.
සමහාර ඉල්ලුම කෙරෙහි බලපෑම. (ඕනෑම කරුණු හතරකට ලකුණු 04)
සමහාර සැපයුම කෙරෙහි බලපෑම.

II. එකඟ විය නොහැක.
සෘණ බාහිරතා මෙන් ම ධන බාහිරතා හමුවේ ද වෙළඳපොල බිඳවැටීම් සිදුවේ. කිසියම් ආර්ථික කටයුත්තක් හේතුවෙන් ඊට සම්බන්ධ නොවන වෙනත් පාර්ශවයකට ඇතිකරන අහිතකර ප්‍රතිවිපාක, සෘණ බාහිරතා නම් වේ. නිෂ්පාදනයේ හෝ පරිභෝජනයේ සෘණ බාහිරතා පවතින විට වෙළඳපල ආර්ථිකයේ අධි පරිභෝජනයක් හෝ අධි නිෂ්පාදනයක් හට ගනියි. මෙම සෘණ බාහිරතා පිළිබඳ සැලකිල්ලක් වෙළඳපල ආර්ථිකයක් තුළින් සිදු නොවන නිසා වෙළඳපොල බිඳවැටීම් සිදුවේ. (ලකුණු 02)

කිසියම් ආර්ථික කටයුත්තක් නිසා ඊට සම්බන්ධ නොවන වෙනත් පාර්ශවයකට දැරීමට සිදුවන ප්‍රතිලාභ , ධන බාහිරතා නම් වේ. නිෂ්පාදනයේ හෝ පරිභෝජනයේ ධන බාහිරතා පවතින විට ආර්ථිකය තුළ ඌණ නිෂ්පාදනයක් හෝ ඌණ පරිභෝජනයක් හට ගනියි. මෙම ධන බාහිරතා පිළිබඳ වෙළඳපොල ආර්ථිකයත් සැලකිල්ලක් නොදක්වන නිසා වෙළඳපොල ක්‍රමය බිඳ වැටේ. (ලකුණු 02)

III.




(සැපයුම් වක්‍රය අනම්‍ය ලෙස ඇඳී තිබිය යුතුය.)

AEE' △ (ලකුණු 02)

සැපයුමේ මිල අනම්‍යතාවක් පවතින භාණ්ඩයක් සම්බන්ධයෙන් ඒකක බද්දක් පැනවීම නිසා බද්දෙන් අඩකට වඩා අඩු ප්‍රමාණයකින් භාණ්ඩයේ මිල ඉහළ යන අතර, වැඩි බදු බරක් නිෂ්පාදකයා විසින් දරයි. බද්ද හේතුවෙන් පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්ත අඩුවන අතර, එම අහිමිවීම් වලින් රජය බදු අයහාරය ලෙස උපයාගත් කොටසට අමතරව සමාජ සුභ සාධනයෙන් කිසියම් ප්‍රමාණයක් අඩු වී ඇත. (මෙය AE E' ත්‍රිකෝණයෙන් පෙන්නුම් කෙරේ) එය අධි බදු බර ලෙස හැඳින්වේ. (ලකුණු 02)

IV. • රාජ්‍ය වියදම් ඉහළ යාම නිසා රාජ්‍යය ඉතුරුම් පහළ වැටීම.
• රාජ්‍ය ආයෝජන සීමා වීම.
• අයවැය හිඟය විශාල වීමෙන් රජයේ ණය ගැනීම් ඉහළ යාම.
• රාජ්‍ය වියදම් පියවීම සඳහා ණය ලබාගැනීම නිසා පෞද්ගලික අංශයට ලබාදෙන ණය මුදල් ප්‍රමාණය සීමා වීම හා වෙළඳපොල ණය පොලී අනුපාතිකය ඉහළ යාම නිසා පෞද්ගලික ආයෝජන පහළ වැටීම.
• ගෙවුම් ශේෂ ගැටළු ඇතිවීම. **(ඕනෑම කරුණු හතරකට ලකුණු 04)**

V. ශ්‍රී මධ්‍යම රජයේ ණය ද දේ.නි.ප්‍රතිශතයක් ලෙස ගත් විට ඉතා ඉහළ අගයක් වාර්තා කරයි.

| මධ්‍යම රජයේ ණය / ද දේ.නි.% | 2019 | 2020 |
|---|---|---|
| | 86.8 | 101.0 |

**(ලකුණු 01)**

එහි බරපතල බව නිවැරදිව අවබෝධ කරගත හැක්කේ ණය සේවාකරණ ධාරිතාව පෙන්නුම් කරන රාජ්‍ය අයහාරය, සමඟ සැසඳීමෙනි.
ණය සේවාකරණ ගෙවීම් රාජ්‍ය අයහාරයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට ආර්ථිකය මත දැඩි පීඩනයක් ගෙන දී ඇති බව වැටහේ. **(ලකුණු 01)**

2019 වර්ෂයේ රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස ගත් විට ණය සේවාකරණ ගෙවීම් 107.0 ලෙස තිබුණද 2020 වර්ෂයේ දී එය 141.9 දක්වා සීඝ්‍ර ලෙස වර්ධනය වී ඇත. මෙය ඉතා බරපතල තත්ත්වයකි.

රජයේ අනෙකුත් වියදම් පියවා ගැනීම පසෙකලා ණය ආපසු ගෙවීමටත් ණය ලබාගැනීමට සිදු වී ඇති තත්ත්වයන් මෙරටින් නිරූපණය වේ. මෙම තත්ත්වය නිවැරදි කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග නොගතහොත් ණය ගෙවීම් පැහැර හැරීම් වැනි බරපතල අර්බුදකාරී තත්වයකට ආර්ථිකය මුහුණ දිය හැක. **(ලකුණු 02)**

(08) I. අ) අඩු සම්පත් පිරිවැයක් පවතින A රට, භාණ්ඩ දෙවර්ගය සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසිය හිමිකර ගනියි. **(ලකුණු 02)**

ආ)

| රට | රෙදි | මෝටර් රථ |
|---|---|---|
| A | $\frac{4}{2} = 2$ | $\frac{4}{2} = 0.5$ (circled) |
| B | $\frac{7}{5} = 1.4$ (circled) | $\frac{5}{7} = 0.71$ |

**(ලකුණු 02)**

A රට විසින් අඩුම ආවස්ථික පිරිවැයකින් යුක්තව මෝටර් රථ නිෂ්පාදනය කරන නිසා මෝටර් රථ නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය A රට හිමිකර ගනියි. **(ලකුණු 01)**

B රට විසින් අඩුම ආවස්ථික පිරිවැයකින් යුක්තව රෙදි නිෂ්පාදනය කරන නිසා රෙදි නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය B රට හිමිකර ගනියි. **(ලකුණු 01)**

II. නාමික ආරක්ෂණ අනුපාතිකය මගින් දේශීය නිශ්පාදකයාගේ මිල ආනයනය කරනු ලබන භාණ්ඩයේ දේශීය වෙළඳපොල මිලෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කෙරේ. එහෙත් නාමික ආරක්ෂණ අනුපාතිකය තුළින් දේශීය භාණ්ඩය වෙත ලැබෙන සැබෑ ආරක්ෂණයේ ප්‍රමාණය නිවැරදිව පිළිඹිබු නොවේ. **(ලකුණු 01)**

නාමික තීරුබදු අනුපාතිකය පනවනු ලබන්නේ ආනයනය කරනු ලබන අවසාන භාණ්ඩයේ වටිනාකම අනුවය. නමුත් දේශීය නිශ්පාදනයන් ආනයනය කරන ලද අතරමැදි යෙදවුම් හා භාණ්ඩ රැසක් තම නිශ්පාදන කියාවලිය සඳහා යොදා ගනියි. මෙම යෙදවුම් හා අතරමැදි භාණ්ඩ මත ද තීරු බදු අයකර ඇති විටෙක නාමික තීරුබදු අනුපාතයට නාමික තීරුබදු අනුපාතිකය පනවනු ලබන්නේ ආනයනය කරනු ලබන අවසාන භාණයේ වටිනාකම අනුව නමුත්, දේශීය නිෂ්පාදකයන් ආනයනය කරන ලද අතරමැදි යෙදවුම් හා භාණ්ඩ රැසක් තම නිශ්පාදන ක්‍රියාවලි සඳහා යොදා ගනියි. මෙම යෙදවුම් හා අතරමැදි භාණ්ඩ මත ද තීරු බදු අයකර ඇතිවිටක නාමික තීරුබදු අනුපාතයට අනුව ගණනය කරනු ලබන නාමික ආරක්ෂණ අනුපාතයෙන් දේශීය නිෂ්පාදකයාට ලැබෙන සැබෑ ආරක්ෂණ ප්‍රමාණය නිවැරදිව පිළිඹබු නොවේ. **(ලකුණු 01)**

මේ හේතුවෙන් ආනයන තීරුබද්දක් පැනවීම නිසා දේශීය නිශ්පාදකයාට ලැබෙන සැබෑ ආරක්‍ෂණයේ ප්‍රමාණය මැනීම සඳහා සඵල ආරක්‍ෂණ අනුපාතය යොදා ගනියි. සඵල ආරක්‍ෂණ අනුපාතය මඟින් යෙදවුම් හා අතරමැදි භාණ්ඩ මත ද තීරු බදු පැනවීම නිසා දේශිය නිෂ්පාදකයා සැබෑ ලෙස ආරක්‍ෂණ ප්‍රමාණය තීරණය කළ හැකිය. එය ගණනය කරනුයේ, (ලකුණු 01)

ERP = (V1-V0/V0) x 100 ලෙසයි. (ලකුණු 01)

(iii) <u>කෙටි කාලීන ක්‍රියාමාර්ග</u>

(i) විදේශ සංචිත යොදා ගැනීම.
(ii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ලබා ගැනීම.
(iii) වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතන වලින් කෙටිකාලීන අරමුදල් ලබා ගැනීම.

(ඕනෑම කරුණු 02ට ලකුණු 02)

22 A/L අපි [ papers group ]

<u>දිගුකාලීන ක්‍රියාමාර්ග</u>

(i) අපනයන විවිධාංගීකරණය.
(ii) සෘජු විදේශ ආයෝජන දිරිමත් කිරීම.
(iii) සම්ප්‍රදායික අපනයන දිරිමත් කිරීම.
(iv) අපනයන ප්‍රවර්ධන කලාප පිහිටුවීම.
(v) විදේශ රටවල් සමඟ ගිවිසුම් වලට එළඹීම.
(vi) විනිමය අනුපාතික ක්‍ෂය වීමට ඉඩ හැරීම හෝ අවප්‍රමාණය කිරීම.
(vii) ආනයන ආදේශක කර්මාන්ත වැඩි දියුණු කිරීම. (ඕනෑම කරුණු 02ට ලකුණු 02)

iv.ආ) <u>මූර්ත දළ දේශීය නිශ්පාදනය පහලයාම</u>

මූර්ත ද. දේ. නිශ්පාදිතයේ පහලයන විට, ආනයනය ඇතුලු හා භාණ්ඩ හා සේවා සඳහා මහජනතාව විසින් කරනු ලබන ඉල්ලුම අඩුවේ. ආනයන ඉල්ලුම අඩුවන විට සිදුවනුයේ විදේශීය මුදල් වෙනුවෙන් සපයනු ලබන දේශීය මුදල් ප්‍රමාණය අඩු වීමයි. මෙය විනිමය අනුපාතිකයේ අගය ඉහල යාමක් ලෙස හඳුන්වනු ලැබේ. (ලකුණු 03)

ආ) <u>උද්ධමන අනුපාතිකයේ ඉහල යාම</u>

රටක උද්ධමන අනුපාතිකය ඉහල යන විට එම රටේ අපනයන තරඟකාරීත්වය පහළ යනු ඇති අපනයනය සඳහා විදේශිකයන්ගේ ඉල්ලුම අඩුවන විට දේශීය මුදල් ඒකකය සඳහා විදේශිකයන්ගේ ඉල්ලුම ද අඩු වේ. එවිට විදේශිය මුදලට සාපේක්‍ෂව දේශීය මුදල් ඒකකයේ වටිනාකම පහළ යනු ඇති විනිමට අනුපාතිකයේ අගය ක්ෂය වීමත් ලෙස හැඳින්වෙන්නේ මෙයයි. (ලකුණු 03)

(09)I. ආර්ථික වෘද්ධිය යනු, කාලය සමග මූර්ත ද. දේ. නිශ්පාදිතයේ අඛන්ඩ ඉහල යාමයි. ආර්ථික වෘද්ධිය නිසා ආදායම් මට්ටම ඉහල යන බැවින්, භෞතික ජීවන මට්ටම ඉහල නංවාගැනීම සඳහා ඉහල ආදායම් මට්මමක් අත්‍යාවශ්‍ය වන බැවින්, ආර්ථික වෘද්ධිය තිරසාර සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් ලෙස පොදුවේ පිළිගැනේ. (ලකුණු 01)

එසේ උවද ආර්ථික වෘද්ධි ක්‍රියාවලි හේතුකොට ගෙන ආර්ථිකයේ හිග සම්පත් උපයොජනය වේගවත් වීමටත් "ස්වාභාවික ප්‍රාග්ධනය හායනට පාත්‍රවීමටත්, සමාජයීය විශමතා පැනනැගීමටත් පිළිවන" වර්තමානයේ ආදයම් මට්ටම ඉහල යාමටද, අනාගත ක්‍රයශක්තිය පහල හෙළීමට හේතුවිය හැකිය. (ලකුණු 01)

ආර්ථික වෘද්ධිය හා තිරසාර සංවර්ධනය අතර නොගැලපීම සැමවිටම දක්නට ලැබෙන්නක් නොවේ. ආර්ථික වෘද්ධිය සැම විටම පාරිසරික හායනයට තුඩු දෙන්නේ ද නැත. ආර්ථික වෘද්ධි ක්‍රියාවලියෙහි ආරම්භක අදියරයන් හි දී පසුබෑමත් ඇති විය හැකියි. එහෙත් ප්‍රතිශීර්ෂ ආදායම් වේගයෙන් වර්ධනය වන විට එම තත්ත්වය දක්නට නොලැබෙන අතර පරිසරයේ ගුණාත්මක තත්ත්වය ද ඉහල යනු ඇත. (ලකුණු 01)

ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය නිසා සමාජයීය ආදායම් මට්ටම ඉහල යාමත් පුද්ලයන්ගේ මූලික අවශ්‍යතාවන් තෘප්තිමත් වීමත් සමාජ සාරධර්ම හා ප්‍රති ප්‍රවාහයන් වෙනස්විය හැකිය. සමාජ විශමතාවයන් හා පාරිසරික ගැටලු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ඇති පරිසර හිතකාමී භාණ්ඩ පරිහරණයට පුද්ගලයා වැඩි වශයෙන් යොමුවනු ඇත. වඩාත් කාර්යක්ෂම මිත්‍රශීලී නිශ්පාද ශිල්ප ක්‍රම භාවිතයට ගනු ඇත.

හෝ

ආර්ථික වෘද්ධිය සමග ආදායම් ඉහල යන විට තාක්ෂණය පර්යේෂන හා සංවර්ධනය යන ක්ෂේත්‍රයන් හි වැඩිවශයෙන් ආයෝජනය කිරීමට අවස්ථාව සැලසේ. තාක්ෂණය ඉහල යාම නිසා ප්‍රතිස්ථාපනය කල නොහැකි සම්පත් උපයෝජනය සීමා කරමින් පරිසරය කෙරෙහි ඇති අයහපත් ප්‍රතිවිපාක අවම කරගැනීමටද පුළුවන.

**(ලකුණු 01)**

(ii) **ප්‍රභලතා** -

- ★ ගොලීය වශයෙන් කෙරෙන සැසඳීම්වලදී සංවර්ධනය මනින වඩාත් තොරතුරු සහිත නිර්ණායකයක් වීම.
- ★ සංවර්ධනයට අයත් දෑ කවරේද සංවර්ධන ක්‍රියාවලියේදී සාර්ථක වී ඇති රටවල් කවරේද යන්න පිළිබඳව දැනුම හා අවබෝධය පුළුල් කරගැනීමට.
- ★ සංවර්ධනය මැනීමේදී යොදාගන්නා ප්‍රතිශීර්ෂ ආදායම් වැනි පටු මිනුම් වලින් හට ගන්නා සීමාකම් ඉවත් කරගැනීමට
- ★ ලෝකයේ රටවල් සංවර්ධන මට්ටම් අනුව වර්ග කිරීමට

**(ඕනෑම කරුනු 03ට ලකුනු 3)**

**දුබලතා** -

- ★ මානව සංවර්ධන දර්ශක සමාහර මිනුමක් වන බැවින් රටවල් අභ්‍යන්තරයේ දැකිය හැකි සංවර්ධන විශමතාවන් හදුනාගත නොහැකිය.
- ★ ගුණාත්මක වෙනස්කම් මෙම දර්ශකයේ නොගැනීම.
- ★ අධ්‍යාපනය මිනුම් කිරීමේදී ප්‍රාථමික අධ්‍යාපනයට යොමුවන පිරිස සැළකුවද අතර මැද දී පාසල් හැර යන ශිෂ්‍ය ප්‍රමාණය සැලකිල්ලට නොගනී.
- ★ සංවර්ධනය කෙරෙහි බලපාන පාරිසරික පැතිකඩ මෙම දර්ශකය තුල අන්තර්ගත නොවේ.

**(ඕනෑම කරුණු 03ට ලකුනු 3)**

iii.
- ★ බදු ව්‍යුහය සාර්ව ආර්ථික ස්ථායීතාවය
- ★ යටිතල පහසුකම් ජාලය
- ★ නීතිමය ක්‍රියාදාමය
- ★ රාජ්‍ය ප්‍රතිපත්ති
- ★ ශ්‍රම වෙළඳපොල
- ★ වෙළඳපොල විවෘත භාවය

22 A/L අපි [ papers grou

**(ඕනෑම කරුණු 04ට ලකුණු 04)**

iv. ශ්‍රම බලකාය වැඩකල හැකි වයසේ ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම, ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය ලෙස හැදින්වේ. **(ලකුණු 01)**

ශ්‍රී ලංකා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතයේ මෑතකාලීන හැසිරීම පහත පරිදි වේ.

| | 2019 | 2020 |
|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය | 52.3 | 50.6 |
| පුරුෂ සහභාගීත්ව අනුපාතය | 73.0 | 71.9 |
| ස්ත්‍රී සහභාගීත්ව අනුපාතය | 34.5 | 32.1 |

- ★ ශ්‍රම බලකායේ පහලයාම සහ ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනයේ ඉහලයාම අනුව, ශ්‍රම බලකාය සහ
- ★ කුටුම්භ ජනගහනය අතර අනුපාතය වන ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතය 2019 වර්ශයට වඩා 2020 වර්ශයේ අඩු වී ඇත.
- ★ මෙහි ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්වය මෙන්ම පුරුෂ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතයද 2019ට සාපේක්ෂව 2020 වර්ෂයේ අඩුවී ඇත.

* ශ්‍රම බලකායේ දිගුකාලීනව පැවත එන ස්ත්‍රී, පුරුෂ භාවය අනුව අසමතුලිතතාවයන් වසංගත තත්ත්වය හමුවේ තවදුරටත් වර්ධනය වී ඇත.
* 2019 වර්ෂයට වඩා 2020 වර්ෂයේ ස්ත්‍රී පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව පරතරය තවදුරටත් වර්ධනය වී ඇත. (38.5 සිට 39.8 දක්වා) (ලකුණු 05)

(10) i.
* සේවා නියුක්ති අනුපාතය පහළ යාමට ඉවහල් වේ.
* පුද්ගලයන්ගේ ආදායම ඉහල යාම.
* දරිද්‍රතාව පහළ යාම.
* කුටුම්භ ඉතුරුම් වැඩිවී කුඩා ව්‍යවසායන් වර්ධනය වීම.
* විදේශ වත්කම් ශක්තිමත් වීම.
* ගෙවුම් ශේෂ ගැටළු වලට ප්‍රබල විසඳුමක් වීම
* මුදලේ විදේශ අගය ඉහළ යාම.
* දේශීය ශ්‍රම වෙළඳපොලේ පුහුණු ශ්‍රම හිඟයක් ඇතිවීම හා සම්පත් සම්භාරය සංකෝචනය වීම.
* ගෘහ සේවය සඳහා කාන්තාවන් සංක්‍රමණය වීම සමාජ ගැටළු වලට හා දරුවන් හුදකලා වීමට හා අනාරක්ෂිත වීමට හේතුවේ.

**(ඕනෑම කරුණු 04ට ලකුණු 04)**

22 A/L අපි [ papers

ii.
* බොහෝ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘති තුල කල් තබා ව්‍යාපෘති නිම කිරීම වෙනුවෙන් ලබා දෙන ප්‍රසාද දීමනා (Bonus) ඇතුලත් වන බැවින් සියලු ව්‍යාපෘති වඩාත් කාර්යක්ෂම ව නිමකිරීමට හැකි වේ.
* රජයේ අරමුදල් වඩාත් කාර්යක්ෂම ව ලෙස වැයකිරීමට මේ යටතේ ඉඩ සැලසෙන බැවින් සමාජ ආර්ථික වැදගත්කම ඇති වෙනත් වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි සීමිත රාජ්‍ය අරමුදල් යොමුකිරීමට අවස්ථාව උදා වේ.
* රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව සහිත ව්‍යාපෘති වල කාර්යක්ෂමතාව වැඩි බැවින් එය අයවැය පරතරය අඩුකරගැනීමට දායක වේ.
* ව්‍යාපෘති ජීවන චක්‍රයේ සෑම අදියරකදීම ඉහල ප්‍රමිති මට්ටමක් පවත්වා ගත හැක.
* රාජ්‍ය වියදම් අඩුකරගත හැකි බැවින් ජනතාව මත බදු බරද අඩුකරගත හැකිය. (ලකුණු 04)

iii දැනුම් ආර්ථිකය යනු-

බුද්ධිමය ප්‍රාග්ධනය මත පදනම් වූ පාරිභෝජන සහ නිශ්පාදන ක්‍රියාවලියකි. දැනුම් ආර්ථිකය සාමාන්‍යයෙන් නිශ්පාදන ක්‍රියාවලියකි. දැනුම් ආර්ථිකය සාමාන්‍යයෙන් සංවර්ධිත රටවල සියලු ආර්ථික ක්‍රියාකාර්කම් වල විශාල කොටසකි. දැනුම් ආර්ථිකය තුළ ස්වභාවික වටිනාකම් වලින් සමන්විත වන අතර, එහි සේවක දැනුමට වටිනාකමක් ඇතත් සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම් මූලධර්මයන් අනුව මෙම වත්කම් ශේෂ පත්‍ර වල ඇතුළත් කිරීමට ඉඩ නොදේ.

**( ලකුණු 02)**

**අභියෝග**

1. ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධි අනුපාතිකය පහළ මට්ටමක පැවතීම.
2. සමාජයේ අධ්‍යාපන මට්ටමක පහළ අගයක පැවතීම නිසා මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා වැය කරන අරමුදල් පහළ මට්ටමක පැවතීම.
3. පර්යේෂණ හා සංවර්ධනය අඩු නිපුණතා සහ අඩු වැටුප් පදනම් කරගත් කාර්මිකරණ ක්‍රියාවලි කර නැඹුරු වීමේ හැකියාව අඩු වීම.
4. ශ්‍රී ලංකාව තුළ පවතින අඩු නිපුණතා සහ අඩු වැටුප් පදනම් කරගත් කාර්මීකරණ ක්‍රියාවලිය නිසා දැනුම් කේන්ද්‍රීය ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය කරා නැඹුරු වීමේ හැකියාව අඩු වීම.
5. ශ්‍රී ලංකාව පහල ආදායම් ලබන රටක සිට පහල මැදි ආදායම් ලබන රටක් බවට පත් වීමත් සමග ශ්‍රී ලංකාවට විදේශ වලින් ලැබෙන ප්‍රදානයන් හා ආධාර සීමා වීම.
6. අධ්‍යාපනය, පුහුණුව, පර්යේෂණ හා සංවර්ධන කටයුතු වලට ආයෝජනය කළ හැකි මුදල් ප්‍රමාණය අඩුවී ඇත.
7. සෘජු විදේශ ආයෝජන අඩු තාක්ෂණය සහිත ශ්‍රම සූක්ෂම කර්මාන්ත වෙත බහුල වශයෙන් ලබා එම නිසා මානව ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීමේ ඉඩ ප්‍රස්ථා අඩු වීම.

**(ඕනෑම කරුණු 04ට ලකුණු 04)**

iv. වාසි

* ගමනාගමන කාලය හා වියදම අඩු වීම.
* රැකියාවේ නිරත වන ස්ථානයට හා කාලසීමාවට අදාල වැඩි පහසුවක් තිබීම හා බාධා අවම වීම.
* රැකියාව හා පෞද්ගලික ජීවිතය අතර වැඩි සමබරතාවක් පවත්වා ගැනීමට හැකි වීම.
* ආයතන වල ජලය විදුලිය වැනි උපයෝගීතා පිරිවැය අඩු වීම.
* කාර්යාල පරිශ්‍රවලට අදාල මෙහෙයුම් වියදම් අඩු වීම.
* අතිකාල හා ප්‍රවාහන වියදම් වැනි කාර්ය මණ්ඩල වියදම් අඩුවීම.
* සේවා නියුක්තියේ ඵලදායීතාව දියුණු වීම.
* සේවා බැඳීම හා සේවා තෘප්තිය වැඩි දියුණු වීම.
* සේවයෙන් ඉවත් වී යාම අඩුවීම.
* ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්වය ඉහල යාම.

(ඕනෑම කරුණු 03 ට ලකුණු 03)

අවාසි

* සියලුම කර්මාන්ත වෘත්තීන් හා රැකියා කාර්යයන් සඳහා මෙම ක්‍රමය යොදා ගත නොහැකි වීම.
* රැකියා පරිශ්‍රයෙන් බැහැර ව සිදුවන කටයුතු වලදී ඇති වන අතපසුවීම් හා අකාර්යක්ෂමතා සාපේක්ෂව ඉහල යා හැක.
* උනන්දුව හා ඵලදායිතාව අඩුවීම.
* තාක්ෂණික හා සන්නිවේදන දුර්වලතා
* රැකියාවේ වගකීම අඩු වීම.
* සේවකයන් සෘජු අධීක්ෂණයට ලක් නොවීම.

(ඕනෑම කරුණු 03ට ලකුණු 03)

22 A/L අපි [ papers group ]